
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නිකිණි අව අටවක පෝදා 2022 අගෝස්තු 19 සිකුරාදා BUDUSARANA FRIDAY AUGUST 19, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 10 පත්‍රය, පිටු 10 ආරම්භය 1965 - 06 - 13

නන්දිවිසාල ජාතක කතාව ඇසුරිනි

# ආස්වාදය පසුපසම ආදීනව ද පැමිණෙනවා

# බොරු කියන්නේ බලාගෙනයි

**භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් පුංචි රාහුල පොඩිහාමුදුරුවන්ට බොරුවේ ආදීනව උපමා උපාමේය මඟින් ඉතා පැහැදිලිව විස්තර කර දුන්නා. එහිදී "එව මෙව බො රාහුල යස්ස කස්සචි සම්පජාන මුසාවාදෝ නත්ථි ලජ්ජා නාහං තස්සකුඤ්චි පාපං අකරණීය නති වදමි."**

යම් කිසිවකු දැන දැන මුසාවාදා බිනීමෙහි ලජ්ජා නැද්ද ඔහු විසින් කිසි පවක් නොකොට හැකි යැයි මම නොකියමි." පැවසූ සේක.

බොරු කියන පුද්ගලයාට කළ නොහැකි වෙනත් පවක් නොමැති බව භාග්‍යවතුන් වහන්සේ වදාළහ. ඕනෑම අකුසලයක් කිරීමෙන් අනතුරුව එය බොරුවක් කියා වසා දැමීමට බොරුකාරයාට ශක්තියක් ඇත. එය ඉතාම අනතුරුදායක ය.

එහෙත් බොරුවේ ආදිනව දත් ගිහි පැවිදි සමහර ප්‍රඥාවන්ත පිරිස් බොහෝවිට බොරුව පරාජය කොට සත්‍ය ජය ගත් අවස්ථා ඇත.

දුටුගැමුණු කුමාරයා සහ තිස්ස කුමාරයා අතර යුද්ධයක් පැවති බව ජනප්‍රවාදයේ සඳහන් වේ. මේ යුද්ධයෙන් පරාජයට පත් තිස්ස කුමාරයා පලා ගියේ ය. පලා යන තිස්ස කුමාරයා පන්සලකට ගොඩ වී එහි වැඩ සිටි හාමුදුරුවන්ගෙන් අවසර ගෙන ඇඳක් යට සැඟවී ගත්තේ ය. තිස්ස කුමරු සොයා එන ( ලුහුබැඳ) දුටුගැමුණු කුමරු පන්සලේ වැඩ සිටි හාමුදුරුවන්ගෙන් තිස්ස කුමාරයා ගැන



දෙහිඅත්තකණ්ඩිය
කජුවත්ත ආරණ්‍ය සේනාසනයේ
ශාස්ත්‍රවේදී
**බිබිලේ ධම්මසිරි හිමි**

විමසීය. ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කළ උන්වහන්සේ " උන් හිටි තැන දැක්කේ නැතැයි" පැවසූහ. සියල්ල තේරුම් ගත් දුටුගැමුණු කුමාරයා බුදුදහම කෙරෙහි තිබුණු ශ්‍රද්ධාව නිසා ම නිශ්ශබ්දව පිටව ගියේ ය.

මෙහිදී එම භික්ෂූන් වහන්සේ මුසාවක් කීවේ නම් එය තමන්ගේ ශීලයට හානියකි. ඇත්ත ප්‍රකාශ කළේ නම් තිස්ස කුමාරයාගේ ජීවිතයට පවා අවධානම් වේ. ඒ නිසයි ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ " හිටගෙන ඉන්නා විට දැක්කේ නැති බව යි" තිස්ස කුමාරයා ඇඳ යටට රිංගුවේ ස්වාමීන් වහන්සේ පුටුවේ වාඩි වී සිටින විටයි. ගැමුණු කුමාරයා එනවිට ස්වාමීන් වහන්සේ හිටගෙනයි සිටියේ. ඉන් යහපත් ප්‍රතිඵල කීපයක් නෙළා ගැනීමට හැකි විය.

එහෙත් අද සමාජයේ බොහෝ දෙනා මුසාවක් පවසා ඉන් ආශ්වාදයක් විඳීමට පුරුදු වී සිටිති. එහි ආදීනව ගැන බොහෝ දෙනාට අවබෝධයක් ද නැත. පංචශීල ප්‍රතිපදාවේ එන හතර වැනි ශික්ඛා පදය වන්නේ " මුසාවාදා වේරමණී ශික්ෂා පදං සමාදියාමි." යන්නයි.

ඒ අනුව බොරු කීමෙන් වැළකීමේ ශික්ෂාවේ පිහිටා සිහි නුවණින් කටයුතු කළ යුතුව ඇත. තම මුඛයෙන් මුදාහරින වචනවල අර්ථය නොදැන වාග්ද්වාරය අසංවර වීම නිසා මේ අනතුර සිදුවේ.

මුසාවේ ආස්වාදයත් ආදීනවයත් ගැන සිහි නුවණ නැති බැවින් නිස්සරණයකට පැමිණිය නොහැක. දැන දැන බොරු කියන පුද්ගලයාට විඳින්නට සිදුවන මහේශාඛ්‍ය වූත්, අල්පේ ශාඛ්‍යවූත් දුක් විපාක බොහෝ ය. මෙලොව පරලොව යන දෙකෙහි ම ඔහු දුකට පත්වන බව ධර්මයේ සඳහන් වේ. ගොළු බවට පත්වීම, මුඛය දුර්ගන්ධ වීම සහ ගොත බවට පත්වීම බොරුවේ ආදීනව ය. තව ද නොකළ වැරැදිවලට දඬුවම් ලැබීම, නින්දා අපහාසවලට බඳුන් වීම, දරු සම්පත් අහිමි වීම, මව්පියන්ට අකීකරු වීම, දීනව උත්පත්තිය ලැබීම ආදී ආදීනවවලට බඳුන් වේ.

බොරු කීමෙන් සකස් වන කර්ම පථය නිසා කල්ප ගණන් නිරයේ පැසීමට සිදු වේ. ඉන් නිදහස්ව, මිනිසත් බවට පැමිණියත් ඉහත සඳහන් ආදීනවයන්ට මුහුණදීමට සිදුවන බව ධර්මයේ සඳහන් වේ. මේ අනුව සත්‍ය පවසා ගුටි බැටවලට හෝ සිරදඬුවමකට හෝ බඳුන් වීම ලාභයකි.

බෝධිසත්වයන් වහන්සේ එක බවයක අභිඤ්ඤලාභී ඍද්ධිමත් තවුසකු ලෙස හිමාලයේ වාසය කළහ. උන්වහන්සේ හිතවත් රජ කෙනකුගේ දේවියක් සමඟ ඇති වූ රාගයක් නිසා තුන්වැනි සිල්පදය පළුදු විය. එහෙත් මිත්‍ර රජුට බොරු නොකියා බෝධිසත්වයන් වහන්සේ හතර වැනි සිල් පදය ආරක්ෂා කළහ.

බුදු පසේ බුදු මහ රහතුන් වහන්සේ ද පාරමී දහම් පුරණය කිරීමේ දී හතරවැනි සිල් පදය ආරක්ෂා කරමින් සත්‍ය පාරමිතාවට ගරු කළහ. බෝධිසත්වයන් වහන්සේගේ "හාරිත තාපස චරිතයෙන් ද, දීපායන චරිතයෙන් ද කියැවෙන්නේ , ඉස්මතු වන්නේත් බොරුවෙන් වැළකීමේ ආනිසංසයයි.

මහත් වූ සැපයක් බලාපොරොත්තු වෙනවා නම් සුළු සුළු සැප අත්හැරිය යුතු බව බුදුරජාණන් වහන්සේගේ අවවාදයයි. එසේ නම් බොරුවක් පවසා තාවකාලිකව ලබන ආස්වාදය අත්හැරිය යුත්තේ ම ය.

එහෙත් අද සමාජයේ බොහෝ දෙනා බොරුවේ ආදීනව නොදත් නිසා සත්‍යයට මුහුණ නොදී පලා යාමට උත්සාහ දරති. වැඩිහිටි බොහෝ මව්පියන් තමන්ගේ දුවා දරුවන්ට විවිධ කරුණු පදනම් කරගෙන බොරු කියති. සිනාසීමට, විශ්මය දැනවීමට, රැවැටීමට, කුඩා දරුවන් නිශ්ශබ්ද කරවීමට, තමන්ගේ යටි අරමුණු ඉටු කර ගැනීමට, දරුවන්ගේ යහපත උදෙසා යැයි ලාමක ආකල්ප පදනම් කරගෙන මව්පියෝ බොරු කියති. දරුවෝ මව්පියන් අනුගමනය කරති.

බොරුවේ ආදීනව නොදත් අහිංසක දරුවෝ බොරුව සාමාන්‍ය වචනයක් ලෙසට පිළිගනිති. මේ නිසා බොරු කීමට ඔවුන් තුළ ලජ්ජාවක්, බියක් නූපදී. බොරුව විහිළුවක් වන අතර, සතුටක් උපදවිය හැකි දෙයක් ලෙසට ඔවුන්ගේ සිත තුළ තැන්පත් වී තිබේ. පසුකාලයේ දී ඔවුන් සමාජ ගතවෙන්නේ බොරුව පදනම් කරගෙන ය.

බොරුවට සමගාමීව යන හොරකම ද ඔවුන් හා එකතු වන්නේ නිරායාසයෙනි. මේ හේතූන් හරහා ඇතිවන ඵලය කෙබඳුවිය හැකි දැයි සිතා ගැනීමට අපහසු නැත.

"අම්භසක්ඛර පේත වස්තුවේ" .... නාන යහළුවන්ගේ වස්ත්‍ර එක යහළුවකු විහිළුවට සැඟෙව්වේ ය. විහිළුව දුර දිග ගියේ ඒ අවස්ථාවේ දී නොවේ. වස්ත්‍ර සැඟවූ යහළුවාගේ මරණයෙන් පසුව ඔහුට විඳින්න වූ ආදිනව ඉතා දුක් සහිත විය. මොහු ප්‍රේත ආත්මයක උපත ලැබීය. ඇඳුම් සඟවා විහිළුවට බොරු කිවූ විපාකය ඵල දුණි. ප්‍රේතයාට ඇඳුම් ද අහිමි විය. කර්මය, කර්මඵලය පිළිබඳ විශ්වාසයක් නොමැති අශ්‍රැතවත් පෘතග්ජනයාට විඳින්නට වන දුර්විපාක බොහෝ ය.

විශේෂයෙන් ම දුරකථන පරිහරණය කරන අද බොහෝ දෙනාට බොරුව රජ කරවීමට දුරකථනය අත්‍යවශ්‍ය භාණ්ඩයක් වී ඇත. මෝහය පදනම් කරගෙන සිදුවන මෙම ක්‍රියාවලිය වයස් භේදයකින් තොරව සිදුවේ. බොහෝවිට වයස්ගත අය සනසාලීමටත්, කුඩා දරුවන් නැළවීමටත්, පෙම්වතුන් හා පෙම්වතියන්ගේ කතා සල්ලාපවලදීත් දුරකථනය ඔස්ස් වැඩිපුරම ගලා එන්නේ මුසාවන් ය. මේ මුසාවන් හරහා බොහෝ දෙනා විඳින්නේ සාමිසවූත්, ලාමකවූත් ආශ්වාදයන් ය. එහෙත් එහි දුක් විපාක ගැන, එහි දීර්ඝකාලීන ආදීනව ගැන සිතන්නේ ද නැත.

තමන් නොදන්නා බව නොදන්නා පුද්ගලයා මෝඩයෙක් බවත්, තමන් නොදන්නා බව දන්නා පුද්ගලයා ප්‍රඥාවන්තයෙක් බවත් ධර්මයේ සඳහන් වේ. ඒ අනුව බොරුවේ ආදීනව හා ආශ්වාදය ගැන කිව යුත්තේ ද එයයි. එසේ නම් සියල්ලෝ ම ප්‍රඥාවන්තයෝ ම වෙත්වා.

# අස්වනු ලැබෙන්නේ වැපිරූ දෙයටයි

*"යො අප්ප දුට්ඨස්ස නරස්ස දුස්සති – සුධස්ස පොසස්ස අනංගනස්ස
නමෙව බාලං පච්චේති පාපං – සුබුමො රජො පටිවාතං ච බිත්තො"*

කාරුණික පින්වතුනි,

ඉහත ධම්මපද ගාථාව පාප වර්ගයට අයත් එකකි. මෙහි දැක්වෙන්නේ කෙලෙස් කිළිටෙන් දූෂිත නොවූ පිරිසුදු අදහස් ඇති පුරුෂයකුට යමෙක් නපුරු අදහසින් දුෂ්ටකම් කළේ නම්, එකී දුෂ්ට අදහස්වලට විපාකය ආපසු ඔහු කරා පැමිණෙන බවයි.

ඒ කෙසේද යත්, යටි සුළඟෙහි සිට උඩු සුළඟට දමනු ලබන සියුම් දූවිලි ආපසු ඔහු කරා එන්නාක් මෙනි. ඒ පිළිබඳ "සුනඛලුද්දක" කතා පුවතෙහි ද දක්නට ලැබේ. එය මෙසේ ය.

පෙර "සුනඛලුද්දක" නැමති වැදි පුත්‍රයෙක් විය. ඔහු දිනක් සුනඛයන් පිරිවරාගෙන දඩයම් කිරීම පිණිස වනගත විය. එහිදී ඔහුට අතරමඟ දී පිණ්ඩපාතයේ වඩින භික්ෂුවක් මුණ ගැසුණි. එවිට කෝපයට පත් වූ වැද්දා "මේ කාලකණ්නි ශ්‍රමණයා හමු වූ නිසා අද කිසිවක් නො ලැබේ". දැනුදු පැමිණෙන්නේ ය. මේ ශ්‍රමණයා සුනඛයා ලවා කවා මරමි යි" සිතා උන්වහන්සේ සැපීමට සුනඛයාට සංඥා කළේ ය. එවිට බුරමින් එන නපුරු සුනඛයා දුටු ස්වාමීන් වහන්සේ බියට පත්ව අසල තිබූ ගසට නැග්ගේ ය.

පසුව දුෂ්ඨ වැද්දා "නුඹට බේරීමට ඉඩ නොදෙමියි" පවසා කෝපයෙන් ගස යටට අවුත් තම ඊතල මිටියෙන් ස්වාමීන් වහන්සේගේ යටිපතුලට විද්දේ ය. තමන් වහන්සේට හිරිහැර නොකරන මෙන් ඉල්ලා සිටියේ ද, නොනවත්වා දිගින් දිගට ම හිරිහැර කළේ ය . එහිදී ඊතල පහරින් බේරීමට උත්සාහ කළ උන්වහන්සේට සිවුර ගැන අමතක වී දැඟලීමෙන් සිවුර ගිලහි නොදැනුවත්ව ම වැද්දාගේ හිස මත සිවුර වැටුණි. එවිට වැද්දා සිවුරෙන් වැසී ගියේ ය.

තෙරුන්ට බුරමින් ගස යට සිටි සුනඛ රැල උන්වහන්සේ ගසින් වැටුණෝ යැයි සිතා උන්ගේ ස්වාමියා හපකොට කා දමන ලදී.

එහි දී වැද්දාගේ අදහස නොව ඊට විරුද්ධ අදහසක් ම සිදුවිය. මේ සිද්ධිය දුටු ස්වාමීන් වහන්සේ ශෝකයට පත්ව චීවරය නිසා "අනේ මොහුට වූ විපතක්" යැයි ලතැවිය.

පසුව මෙම සිද්ධිය ජේතවනාරාමයට ගොස් බුදුරදුන්ට පැවසිය යුතු යැයි සිතා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ සිදු වූ සියල්ල උන්වහන්සේ, බුදුරජාණන් වහන්සේට පැවසූහ. ඊට තමා ද කොටස්කරුවකු වූවා දැයි විමසූහ. එවිට බුදුරදුන් ,

"මහණෙනි, මෙය ඔබගේ වරදින් සිදුවූවක් නොව, නපුරු අදහසින් ඔබට අනතුරු කිරීමට පැමිණි වැද්දා කළ දෙය ඔහුගේ විනාශයට ම හේතු වූ බව දේශනා කළහ. "එම දේශනාව අවසානයේ දී ස්වාමීන් වහන්සේ රහත් විය.

මෙම ලෝකයේ වරදක් සිදු නොවන අය සොයා ගැනීමට අපහසු ය. සියල්ලන්ගෙන් ම වැරැදි සිදුවේ. යමකුගේ ක්‍රියාවකින් හෝ වචනයකින් අපගේ සිත් දූෂ්‍ය වේ නම් එය විපතක් නොවන පරිදි සංසිඳවා ගැනීම විනා ඊට පළිගැනීමට සූදානම් නොවිය යුතු ය.

අප රටෙහි බොහෝ අයගේ වැරැදි පුරුද්දක් වනුයේ අනුන්ගෙන් පළිගැනීම යි. උසස් යැයි සම්මත අය නම්බුව හෝ කීර්තිය නිසා ද, පහත් පන්තියේ අය ලාභ ප්‍රයෝජන නිසා ද අනුන්ට අනතුරු පමුණුව යි.

පියාගෙන් වූ වරදට පුත්‍රයාගෙන් ද, පුත්‍රයාගෙන් වූ වරදට පියාගෙන් ද එකිනෙකාට පළිගැනීමට උත්සාහ කරයි. මෙකී ක්‍රමය සමාජයේ බොහෝ පවුල් පරිසරයන් හි දක්නට ලැබෙන අතර, තමා පමණක් සැප විඳීමට උත්සාහ කරනු පෙනේ.

පින්වතුනි, වපුරන බීජයට අනුව අස්වැන්න ලැබේ. එය සිහිතබා ගත යුතු ය. වී වපුරා කුරක්කන් ද, කුරක්කන් වපුරා වී ද ලබා ගත නොහැකි ය. අන් අය විනාශ කිරීමට ඇතිවන නපුරු සිතිවිල්ල ම තමා විනාශය කරා පමුණුවන බැව් නිතර සිහිතබා ගත යුතුයි.

යටි සුළඟෙහි සිට උඩු සුළඟෙහි සිටින අයට කොපමණ දූවිලි විසිකළත් ඔවුන් අපිරිසුදු කිරීමට නොහැකි ය. ඒ සියල්ල ආ පසු තමා කරා පැමිණ තමා ම අපිරිසුදු කළත් දුෂ්ට අදහසින් අන් අයට විපත් කිරීමට සිතන තාක්, සිතිවිලි යොදන තාක් උපක්‍රම කවදා නමුත් තමාගේ ම විනාශයට හේතු වේ. කෙනකුගේ අදහස්වලට විරුද්ධව අදහස් ප්‍රකාශ කළ ද එහි සත්‍ය අසත්‍ය නොසොයා අදහස් ප්‍රකාශ නොකළ යුතුයි. එසේ නොවුණහොත් ඔවුන් පළිගැනීමට පෙළඹේ.

මෙසේ කල්පනා කරන විට අවංක ඍජු ගතිවලින් යුතු සත්‍යවාදී අයට අපරාධවලට ඉඩ නැති බව පෙනේ. යහපත් අදහසින් කටයුතු කරන මිනිසුන්ට ගෞරව ප්‍රශංසා කිරීම දියුණු වන මනුෂ්‍යයන්ගේ ගතිය යි.

පින්වතුනි, සැබෑ මිනිසකු වීමට නම් "සුනඛලුද්දකයාගේ" කථාව සිහිපත් කර ගෙන අනුන්ගෙන් පළිගන්නා අදහස අත්හැරිය යුතු ය. එසේම පිදිය යුත්තන් පිදිය යුතු ම ය. ඔබ සියලු දෙනාට ම උතුම් නිවන් සුව උදාවේවා

සියලු සත්වයෝ සුවපත් වෙත්වා

ගාල්ල මානවිල බෙත්තාරාමාධිවාසී
සවුත්ලන්ඩ් බාලිකා විද්‍යාලයේ ධර්මාචාර්ය
ශාස්ත්‍රපති
**දෑරංගල මංගල හිමි**



## තනිකම

දුක සැප දෙකම එක විලසට වැළඳ ගති
සම්බුදු දහම් නියමයටම දිවි ගෙවති
එනමුත් ලොවේ මිනිසුන් ළඟ දුදන ගති
නැති කර දිවි ගෙවන්නට නම් නොහැකි වෙති

මුදල් හදල් ලැබෙනා විට දෙමාපියන් තම දරුවන්
කාගේ කවුද යන වග දැන් බැහැර ගොසින් කාගෙ දොසක්
දේපළ එක් රැස් කරමින් නිති සැප සම්පත් පතමින්
කළ හැකි හැම ඇවැඩ කරනුයේ කුමට ද කුරිරු සිතින්

යුතුකම කුමක්දැයි කිසි දින බැලුවා ද
තම සැප මිසක් අනුනගෙ දුක දුටුවා ද
සැප ළඟ දුකයි කියලා නුඹ සිතුවා ද
තමන්ගෙ දුකේ දී නුඹ කලබල වී ද

අටලෝ දහම කාටත් පොදු දෙයකි ලොවේ
ඒ දහමට යටත් නොවනා කෙනකු නොවේ
ලැබූ තම දිවිය හරි මඟ ගෙන ගියොත් ලොවේ
මියගිය පසුත් තම නම නිති රැකෙයි ලොවේ

පන්සිල් රකින උවසුන් වෙත බුදු දහමේ
නිති සුව ලැබේ දම් සුව ඇසුරේ මහිමේ
බුදු හිමි දෙසූ සදහම් සිසිලස මහිමේ
තුන් ලොව සැමට සැමදා සරණයි දහමේ

ජාති ජරා මරණ ගොඩේ අපි දඟලනවා
ඒවා බදාගෙන අප සැම රණ්ඩු කරනවා
බදා ගත්ත දේ හැම අතහැර අපි යනවා
දෑත හිස්ව යන සසරේ අපි තනි වෙනවා

**ඇම්.ජී.ඇම්. ශ්‍රියාලතා**
හෝමාගම



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
නිකිණි අව අටවක 2022-08-19

## සැබෑ බෞද්ධයා

සමාජයේ පැසසුම් ලබන්නට අපි බොහෝ දෙනෙක් කැමැත්තෙමු. එහෙත් වැඩිපුර හිමි වන්නේ ගැරහුම් ය. ඒ ලෝ දහමේ හැටි ය. නරක කරන පුද්ගලයාටත්, හොඳ කරන පුද්ගලයාටත් ගැරහුම් සේ ම පැසසුම් ද ලැබිය හැකි ය.

මේ ලෝකයේ නරක කරන අය, බොරුවෙන්, වංචාවෙන් කටයුතු කරන අය බලා සිටිද්දී ම දියුණු වනවා යැයි, සමාජයේ පිළිගැනීමට ලක්වෙනවා යැයි කෙනෙක් සන්තාපයට පැමිණෙති. එහෙයින් ම තමන් ද හොඳ කරන්නේ කුමටදැයි කල්පනා කරති. එය වැරැදි සංකල්පයකි. වරදක් කළ පුද්ගලයා බොරුවෙන් එය වසා ගත්තද, පිරිසුදු තැනැත්තෙක් සේ සමාජයේ පෙනී සිටිමින් කීර්තියක් ලබා ගත්ත ද තමන් වැරැදි බව ඔහුගේ සිත දනී. අනුන් රැවටීම ගැන වැරැදි හැසිරීම ගැන, ඒ තැනැත්තාට තමන්ගෙන් සමාවක් ලැබෙන්නේ නැත. බාහිරව නොපෙණුන ද අභ්‍යන්තරයෙන් ඔහු දැවෙන්නේ ය.

දැවීමෙන් තැවීමෙන් තොර වූ මානසික සුවතාවෙන් ජිවත් වන්නටනම් අපගේ ජීවන රටාව තමන්ට සේ ම අනුන්ටත් අර්ථකාරී එකක් විය යුතු ය. තමන්ගේ ආධ්‍යාත්මයට සේ ම අනුන්ට තමන්ගෙන් වරදක් නොවිය යුතු ය. යුතුකම් වගකීම් ඉටුවිය යුතු සෑම තැනම එහි අනලස් විය යුතු ය. නොපැකිළ විය යුතු ය. එවිට ලැබෙන කීර්තිය, සමාජයේ ප්‍රශංසාව සුපසන් සිතින් විඳ දරා ගන්නට හැකි වනු ඇත.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සමාජයේ අපවාදයට ලක්වන පුද්ගලයකු පිළිබඳ හඳුන්වා දුන්නේ, ඔහු තමන් තුළ ඇති ඒ අයහපත් ගුණ ධර්ම නිසා ම නැණ ඇති පුද්ගලයන් විසින් දොස් ඇති කෙනකු සේ සලකනු ලබන බව ය. සමාජයේ අපවාද සහිත වන්නේ, බොහෝ පව් ද රැස් කරන බව ය. ඔහු අන් කවරකු හෝ නොව තම මව, පියා, තථාගතයන් වහන්සේ හා තථාගත ශ්‍රාවකයන් වහන්සේ යන සතර දෙනා කෙරෙහි වරදවා පිළිපදින නුගත් අසත්පුරුෂයා ය. අනුවණයා ය. ඔහු ගුණ මුලිනුපුටා දැමූ හෙයින් නැසුණා වූ චිත්ත සන්තානයක් ඇති ජීවිතයක් ගත කරන්නේ ය.

මෙවැනි පිරිස් අප අතර මොන තරම් නම් සිටිනවා ද? වැඩි දෙනෙක් බෞද්ධ යන නාමය අත්පත් කරගන්නේ උපතිනි. ඒ මව්පියන් බෞද්ධවීම නිසා ය.

එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ උපතින් කිසිවකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු හෝ නොවන බව ය. ඔහුගේ ක්‍රියාවෙන්ම ඒ ඒ තත්වයට පැමිණෙන බව ය. බෞද්ධකම ද එවැනි ය. නාමිකව බෞද්ධ වූ පමණින් කෙනෙක් බෞද්ධයෙක් වන්නේ නැත. ධර්මය ප්‍රායෝගිකව තම ජීවිතයට පුරුදු පුහුණු කළ යුතු ය.

ශ්‍රද්ධාවෙන් තෙරුවන් සරණ ගිය පුද්ගලයා කිසිවිටෙක තථාගතයන් වහන්සේට, ශ්‍රී සද්ධර්මයට හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේට වරදවා පිළිපදින්නේ නැත. අදැහැමිකම්වලට අනුගත වන්නේ නැත. ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී යන බුදු වදන අනුව යයි. දහමට පිටුපා වැරැදි නොකරයි. එවැනි පුද්ගලයා කිසි කලෙකත් තමන්ගේ මවට පියාට වරදවා පිළිපදින්නේ නැත. ජීවිතය බබළන්නේ එවැනි මිනිසුන්ගේ ය. සමාජයේ බැබළීම එවිට ය.

# සිත නොසන්සුන් ද? පාලනය කරන්නේ මෙලෙසයි



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

**සිත පිරිසුදුව පවත්වා ගැනීම සඳහා දෛනික ජීවිතයේ සමථ භාවනා ක්‍රමයක් පළමුව පුරුදු කර ගත හැකි ය. බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, මෙත්තානුස්සති, ආනාපානසති ආදි සාමාන්‍ය ජීවිතයකට ගැළපෙන භාවනා ක්‍රමයක් මඟින් සිත තුළ පවත්නා තරහව, අමනාපය, වෛරය, නොසන්සුන්බව පාලනය කර ගත හැකි ය.**

මෙය දෛනික ජීවිතයේ පුරුද්දක් බවට පත්වූ විට සිත තුළ ශ්‍රද්ධාව. කරුණාව. මෛත්‍රිය, පරිත්‍යාගය, සිතේ සන්සුන් බව වැඩෙන්නට පටන් ගනී. රාගය මානය, ඊර්ෂ්‍යාව දැඩිව දැනෙන සිත්වලට හෝ චරිතවලට අසුභානුස්සති හා මරණානුස්සති වැනි භාවනා ක්‍රමයක් මගින් සිත පාලනයට ද, ඉන් අනතුරුව සන්සුන් බවට ද පත්කර ගැනීමට බහුල ලෙස අවස්ථාව සැලසේ.


මහා සතිපට්ඨාන සූත්‍රයෙහි ඉගැන්වෙන සතර සතිපට්ඨානය අරමුණු කොට ඇත්තේ නිවන ය. කෙලෙස් ඉවත්ව ගිය පසු සිතේ ඇතිවන නිවනට පෙර, අනුගමනය කළ යුතු ගමන් මඟ ආරම්භ කොට ඇත්තේ කායානුපස්සනාවෙනි. කයෙහි පැවැත්ම කෙරේ මනා සිහිනුවණින් කටයුතු කිරීමයි.

"ආතාපි සම්පජානො" කෙලෙස් තවන හෙවත් නැති කරන වීර්යයෙන් යුතුව කය පවත්වා ගැනීමයි. වර්තමානයෙහි බොහෝ අයෙක් ස්ථූලබව, දියවැඩියාව,අධික රුධිර පීඩනය හා මත් වතුර හා මත්ද්‍රව්‍ය මුල්කොට ගත් රෝගයන්ට උරුම කම් කියන්නේ , සිතේ පාලනයක් නොමැතිකම හා ඒ සමඟම කයෙහි පැවැත්ම කෙරේ මනා අවධානයකින් තොර පැවැත්මක් ඇතිකර ගැනීම නිසා යි.

"භෝජනම්හි අමත්තඤ්ඤුං" (ධම්මපදය) භෝජනයෙහි පමණ නොදන්නා විපතට පත්වෙයි. එමෙන්ම "කුසීතං හීන වීර්යං"අලස වූ හා දුර්වල වීර්ය ඇති අය නිසි සේ කය නොවෙහෙස වීම නිසා ද විපත්වලට පත්වෙයි. පුරුදු නොකරන ලද සිත මානසික පීඩාවන්ගෙන් ආරම්භ කොට කායික ලෙඩ දුක් දක්වා රැගෙන යන අයුරු ඉතාමත් පැහැදිලි ය. වේදනානුපස්සනාවේ දී, ඉන්ද්‍රියයන් මඟින් සිතට හසුවන හා දැනෙන සියලු විඳීම් ඇතිවී නැතිවී යන අයුරු දකින්නට සිත පුරුදු කිරීමෙන් දුක්ඛ වේදනාවක් නම් අඩු කර ගැනීමට හෝ වේදනාව නොදැනී යාමට අවස්ථාව සලසා ගත හැකි ය. දුක්ඛ වේදනාව දිගින් දිගටම පැතිරී පවතින්නේ වේදනා සිතිවිල්ල වෙනස්වී යන බව අමතක කොට "මගේ" යැයි සිතින් ස්ථිරව අල්ලාගෙන සිටීම නිසා ය.

චිත්තානුපස්සනාවේදි ව්‍යාපාදය (තරහව) හා රාගය වැනි සිතිවිලි දෙස විද්‍යාඥයෙක් පරීක්ෂණයකට ලක්කරනු මෙන් මගේ යැයි නොගෙන එම සිතිවිලි හටගැනීම වෙනස්වීම, හා එම සිතිවිලිවල ඇති, අනිටු විපාක ලෙසින් බරපතලකම නුවණින් විමසා බැලිය යුතු ය. මෙම විමසා බැලීම ඒවායෙහි පාලනයට හේතුවේ. එවැනි සිතිවිලිවල පාලනයක් නොවූ විට එම සිතිවිලිවල ඇති "තද ස්වභාවය" මොළයට දැනී, මොළය මගින් නහර හා පේශිවලට ද, එය ලේ ගමනාගමනය ඔස්සේ සමස්ත ශරීරයෙහි ම නිශේධනාත්මක වෙනසක් කිරීමට ද සමත් වෙයි. "මනසා සංවරො සාධු" මනස සංවර වීම කයෙහි සංවරයට හේතුවකි. සිත රාග, දෝස, මෝහා දි කෙලෙස්වලින් ටිකෙන් ටික මිදී නීවරණ ධර්මයන්ගේ වැටහීම ලබනුයේ සිතේ කයේ ප්‍රමුදිත බව වෙයි. ප්‍රමුදිතයා හට ප්‍රීතිය හටගනී. ප්‍රීතිය හටගත්තේ කය සංසිඳේ. සන්සිඳුණු කය ඇතියේ සුව විඳින්නේ, සුව විඳිනුයේ සිත සමාහිත වෙයි.

> **භෝජනයෙහි පමණ නොදන්නා විපතට පත්වෙයි. එමෙන්ම , අලස වූ හා දුර්වල වීර්ය ඇති අය නිසි සේ කය නොවෙහෙස වීම නිසා ද විපත්වලට පත්වෙයි.**





# මුදුගුණය ඇති තැන ලැබෙයි ලොවට ම සිසිලස



උදම්මිට උත්තමාරාම
පුරාණ විහාරයේ
**මොරටුවේ**
**ආනන්ද හිමි**

**ජනතාව රඤ්ජනයට – සතුටට පත්කරන්නේ රජු ය. ඈත අතීතයේ නොදියුණු සමාජයන්හි දුබලයා මැඩලීමේ කැලෑ නීතිය මැඩ ජන සමූහයා ගේ ආරක්ෂාව, සමාජ සාධාරණත්වය, හා සමාජ ප්‍රගමනය උදෙසා ජන සම්මතවාදීව පාලකයකු වෙත ජනතාව සතු බලය පවරා දීමෙන් රජ පදවියේ ආරම්භය සිදුවිය.**

රටක යහ පැවැත්ම, ජනතා සුඛසිද්ධිය පිණිස රාජ්‍ය පාලනයෙහිලා අසහාය ජගදාචාර්ය බුදුන් වහන්සේගේ මඟ පෙන්වීම්, ගුරුහරුකම් ගුරුකොට ඒ අනුව යම් රාජ්‍ය විචාරන්නේ නම්, එබඳු රටක අභිවෘද්ධියට ද, ජනතාවගේ හිත සුව පිණිස ද, නූපන් අනාගත පරපුරේ සුරක්ෂිත බව පිණිස ද, ප්‍රබුද්ධ සමාජයක උදාව පිණිස ද මැනවින් පිහිටාධාර වෙයි.

එදා මගධයේ අජාසත්ත රජතුමා වජ්ජීන්ගෙන් වෛශාලිය අත්පත් කර ගැනීමට මත්තෙන් ඒ පිළිබඳ තවදුරටත් දැන උගත් උපදේශකයන්ගෙන් විමසීමට තරම් දූරදර්ශී විය. ස්වකීය අග්‍රාමාත්‍ය වස්සකාර බමුණා බුදුරදුන් වෙත පිටත්කර හැරියේ කිසිදා නොවරදින උපදේශයන් ලබා ගනු පිණිස ය.

රාජ්‍ය පාලනයෙහිලා ගුරුකොට ගත යුතු, සෑම රාජ්‍ය පාලකයකුගේ ම අවධානයට ලක්විය යුතු රාජ්‍ය පාලන මූලිකාංග එදා අජාසත් රජු මෙහෙයවීමෙන් බුදුරදුන් වෙත සැපත් වස්සකාර බමුණාට බුදුරදහු ඉගැන්වූ සේක.

සමාජ ප්‍රගමනයට, ජනතා උන්නතියට ඉවහල් වන පුරාණ වජ්ජීන් අනුගමනය කළ සප්ත අපරිහාණිය ධර්මතා බුදුරදුන්ගේ නොමඳ ප්‍රශංසාවට බඳුන් වූ අතර, මෙම පිළිවෙත් අනුව යම් පාලක පිරිසක් රටක් මෙහෙයවත් ද එම ධර්මතා රකින තුරු එබඳු රටක් සතුරු උපද්‍රවාදීයෙන් තොර බැව් බුදුරදුහු වදාළහ.

නිතර රැස්වීම, සමඟිව රැස්වීම, නොපැනවූ අයබදු නීති නොපැනවීම, පැනවූ නීති රීති නොඉක්මවීම, වැඩිහිටි රජදරුවන්ගේ උපදේශ අනුගමනය කිරීම, කුල කාන්තාවට සැලකිලි දැක්වීම, චිරාගත සම්ප්‍රදායානුකූලව වජ්ජි සිද්ධස්ථානවලට සැලකිලි දැක්වීම, තම රටට පැමිණෙන රහතන් වහන්සේ රැක බලා ගැනීම

එදා ලිච්ඡවී පාලන තන්ත්‍රයේ ගැබ්ව තිබූ සාමූහිකව රැස්වීම, සමඟිව සාකච්ඡා කිරීම යන කරුණු නූතන ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්මයන්හි ප්‍රභවයට මොනවට පිහිටාධාර වී ඇත.

ජන සම්මතවාදී ආණ්ඩුවක්, පාලන ක්‍රමයක් බුදුරදුන්ගේ ප්‍රශංසාවට බඳුන් වුව ද එකී පාලන තන්ත්‍රය තුළින් ධර්මානුකූල බව විද්‍යමාන නොවේ නම් එය බුදුන් වහන්සේගේ ඇගයීමට පාත්‍ර නොවීය.

එනිසාම පාලන ක්‍රමයක් තුළින් ධර්මානුකූල බව ප්‍රකට නොවන්නේ නම් එම පාලනය යහපත් හෝ මහජන හිත සුව පිණිස වූවක් ය යන්න පිළිගත නොහැකි වෙයි. රාජ්‍ය පාලකයා රට වැසියාගේ අර්ථ සිද්ධිය පතා, රටේ සම්පත් සුරක්ෂණය කළ යුතු අතර, විපුල ඵලදායිව අනාගත අර්ථලාභීන්ගේ උන්නතිය පතා ආරක්ෂා කොට ප්‍රවර්ධනය කළ යුතු ද වෙයි.

කරුණාබර ප්‍රඥා සම්පන්න පියකු තම දරු මල්ලන්ගේ මතු දවස ගැන, ඔවුන්ගේ හිත වැඩ පිණිස ස්ව වස්තු සම්භාරය, දේපළ ආරක්ෂා කරන්නා සේ ධාර්මික පාලකයා අද හෙට සහ මතු පරපුරේ අර්ථ ලාභය පිණිස රටක සම්පත් හැසිරවිය යුතු ය.

මෙම රාජ්‍ය කාර්යභාරය නොපිරිහෙළා ඉටුකිරීමට නැණ නුවණ ඇති නූතන සමාජ සම්මානයට අනුකූල උගත්කම් සපුරාලීම පමණක් කිසිසේත් ම ප්‍රමාණවත් නොවෙයි. බුදුන් වහන්සේ ධාර්මික රාජ්‍ය පාලකයකු සතුවිය යුතු අංග දීඝනිකායේ කූටදන්ත හා අග්ගඤ්ඤ සූත්‍ර තුළින් උගන්වා වදාළ සේක.

රාජ්‍ය පාලකයා ධාර්මික විය යුතු ය, ශ්‍රමණ බ්‍රාහ්මණයනට ගරු කරන්නකු විය යුතුය. යහපත් ක්‍රියාවන්හි නිරතවන්නකු විය යුතු ය. බුද්ධිමතකු වීම, උගතකු වීම, කවර ගැටලුවක් වුව අතීත, වර්තමාන, අනාගත වශයෙන් විග්‍රහකොට බැලීමට හැකිවීම, මහා ප්‍රඥයකු වීම යන කරුණු ධාර්මික පාලකයකු සතුවිය යුතු ගුණාංග වෙයි.

මෙවන් ගුණයන්ගෙන් සමන්විත වූ පාලකයා ධර්මානුකූල බව ප්‍රතිබිම්භනය වන ආකාරයෙන් ආණ්ඩු කෙරේ නම් බුදුදහමට අනුව එය ප්‍රශස්ත රාජ්‍ය පාලනයකි. මෙබඳු අනඟි චින්තනයකින් පොහොසත්ව ක්‍රියා කළෝද දඹදිව ධර්මාශෝක මහ නිරිඳාණෝ ය.

දිග් විජය හැරදා ධර්ම විජය පිළිවෙත කර ගත් දම්සෝ නිරිඳාණෝ සැබෑවට ම ජනතා හිත සුව සදා ලෝවැඩ ධර්මය බෙදා ජන සන්තානය තුළ අමරණීයත්වයට පත්වූහ. බුදුදහමේ ආභාසය ලත් අශෝක පාලන තන්ත්‍රය දඹදිව ප්‍රභාවතී යුගයක් වූයේ ය.

බහුතරයේ යහපත පිණිස, ප්‍රජාතන්ත්‍ර වාදය ගැන ඒබ්‍රහම් ලින්කන්ට – වුඩ්රෝ විලිසන්ට පළමුව මාගේ බුදුපියාණෝ එදා පළමු රහත් සැට නමහට උගැන්වූ සේක.

බරණැස ඉසිපතනාරාමයේ දී පළමු ධර්මදූත පිරිසට "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය, ලෝකානුකම්පාය, අත්ථාය හිතාය, සුඛාය දේව මනුස්සානං"

"මහණෙනි බොහෝ දෙනාට හිත පිණිස ද, බොහෝ දෙනාට සැප පිණිස ද, ලොවට අනුකම්පා පිණිස ද, දෙව් මිනිසුනට වැඩ පිණිස ද, හිත පිණිස ද, සැප පිණිස ද චාරිකාවේ හැසිරෙව්. යනුවෙන් දේශනා කළ සේක. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලාරම්භයට, සම්භාවයට බුදු දහමේ පිටිවහල මින් මොනවට ප්‍රත්‍යක්ෂ වෙයි. ප්‍රජාතන්ත්‍රවාදයේ මහ ගෙදර මහා භාරතය බැව් මින් මොනවට ස්ඵුට කරයි. පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායකයේ පනත් කෙටුම්පත් නීතිගත වන්නේ තෙවරක් සම්මත කිරීමෙනි.

මෙම ක්‍රමය බුදුදහමේ ආභාසයෙන් පැන නැඟී බැව් ප්‍රකාශ කරනුයේ අප නොව වෙස්ට්මිනිස්ටර් ක්‍රමයේ තිඹිරිගෙය වූ මහා බ්‍රිතාන්‍යයේ සෙට්ලන්ඩ් සාමිවරයා ය.

වස්සාන කාලයේ – වැසි සමයේ චාරිකා චරණයෙන් චාරිකාවේ හැසිරීමෙන් වැළකී ගත කිරීම පෞරාණික ආවේණික ධර්මතාවකි. පසු කලෙක දී භික්ෂු සංස්ථාව ව්‍යාප්ත වෙද්දී මේ ගැන නොසැලකිලිමත්වූ භික්ෂූහු වැසි සමයේ ද තැන තැන සැරූහ. මේ චාරිත්‍ර ධර්මය කඩ කිරීම මහජනයා නොඉවසූහ. නොසතුටට පත් ජනයා මෙබඳු වැසි සමයේ තැන තැන හැසිරෙන භික්ෂුව කෙරෙහි කලකිරුනහ. දොස් කීහ.

භික්ෂු පිරිසක් මේ මහජන අදහස බුදුරදුන්ට දැන්වූ විට "අනුජානාථ භික්කවේ වස්සානේ වස්සං උපගත්තුං' යනුවෙන් වස්සාන සෘතුවේ භික්ෂුවට වස් එළඹෙන්නට බුදුරදහු නියම කළහ.

මින් ගම්‍ය වන්නේ මහජන මතයට බුදුපියාණන් වහන්සේ සංවේදීව ගරු කළ බවයි. එසේ ම සුදොවුන් පිය මහ රජාණෝ "පුත්ත පේමං භන්තේ" යනුවෙන් දරු සෙනෙහස කියා පාමින් බුදුරදුන් අභියස වැඳ වැටුණු කල ස්වාමීනී, මව්පිය අවසරයකින් තොරව දරුවකු පැවිදි නොකරනු මැනවැයි කළ ඉල්ලීම පිළිගත් බුදුරදහු මව්පිය අවසර නො ලද දරුවකු පැවිදි නොකරව් යනුවෙන් ප්‍රඥප්තියක් පැනවූ සේක.

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් වූ රාජ්‍ය පාලන තන්ත්‍රයෙන් පාලිත සමාජය සුඛිත මුදිත ය. ගැටුම් ගැටලු අවම ය. සංහිඳියාවෙන් සාමකාමී වූ, සමෘද්ධිමත් ජන ජීවිතයකට ඒ තුළින් පාඩම් උගන්වයි.

ජනතාව කෙරෙහි ලෙන්ගතුව, දයාබරිතව රටක් රාජ්‍යයක් කරන්නේ කෙසේ දැයි බුදුරදුන් අවධාරණය කළ සේක. දසරාජ ධර්මයෙන් රට කිරීම, රජුගේ දැහැමි බව, රටේ ජනතාවගේ සුබ සිද්ධියත්, ගහකොළ සතාසීපාවාගේ සාධනීය තත්ත්වයත් පෙන්නුම් කරයි.

**ඉතිරිය 07 පිටුවට ...**

# කුසලයට මුල් වන්නේ යහපත් දැකීමයි

**අපගේ ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ වදාළේ සම්මා දිට්ඨිය සියලු කුසල ධර්මයන්ට මුල් වන බවයි.**

සම්මා දිට්ඨිය යනු කුමක්දැයි කියා විග්‍රහ කරන අවස්ථාවල දී භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධ ඤාණය සම්මා දිට්ඨිය බවයි (දුක්ඛේ ඤාණං, දුක්ඛ සමුදයේ ඤාණං, දුක්ඛ නිරෝධේ ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදාය ඤාණං).

එමෙන්ම මජ්ඣිම නිකායට අයත් මහා චත්තාරීසක නම් සූත්‍ර දේශනාවේ දී ශාස්තෘන් වහන්සේ සම්මා දිට්ඨිය දෙයාකාරයකට විස්තර කොට වදාළා. එනම් ලෞකික සම්මා දිට්ඨිය සහ ලෝකෝත්තර සම්මා දිට්ඨිය ලෙස යි.

## දිව් මඟ සැපවත් කරයි

එහි දී ලෞකික සම්මා දිට්ඨිය කෙලෙස් සහිතයි , නමුත් පින උපද්දවා දෙනවා , අනාගතයේ සැප විපාක උදා කර ගැනීමට උපකාරකයි කියා භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්නා. ලෞකික සම්මා දිට්ඨිය අංග දහයකින් යුතු නිසා 'දසවස්තුක සම්මා දිට්ඨිය කියාත්, කර්ම කර්මඵල විශ්වාසයෙන් යුතු නිසා 'කම්මස්සකතා සම්මා දිට්ඨිය' කියාත් හඳුන්වනවා. භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ එම අංග දහය මේවායි.

- දන් දීමෙන් යහපත් විපාක ලැබෙන බව පිළිගන්නවා.
- ඇප උපස්ථාන කිරීමේ, සේවා කටයුතුවල යහපත් ආනිශංස ඇති බව පිළිගන්නවා.
- වන්දනාමාන කිරීමේ, පුද සත්කාරවල යහපත් විපාක ලැබෙන බව පිළිගන්නවා.
- මව කියා විශේෂ ගුණයෙන් යුක්ත කෙනෙක් ඇති බවත්, මවට සැලකීමේ යහපත් විපාක ඇති බවත් පිළිගන්නවා.
- පියා කියා විශේෂ ගුණ දරන කෙනෙක් ඇති බවත්, පියාට සැලකීමේ යහපත් විපාක ඇති බවත් පිළිගන්නවා.
- කර්මානුරූප ව මෙලොව උපතක් කරා ආ බව පිළිගන්නවා.
- කර්මානුරූප ව පරලොව උපතක් කරා යන බවත් පිළිගන්නවා.
- යහපත් අයහපත් කර්මවල, යහපත් අයහපත් ප්‍රතිවිපාක ඇති බව පිළිගන්නවා.
- කර්මානුරූපී ව ඕපපාතික ව උපදින සත්වයන් (දිව්‍ය, බ්‍රහ්ම, ප්‍රේත, අසුර, නිරිසතුන් ආදී) සිටින බව පිළිගන්නවා.
- යහපත් මඟෙහි ගමන් කළ, යහපත් මඟට පිළිපන්, මෙලොව පරලොව තමන්ගේ ම අවබෝධයෙන් සාක්ෂාත් කොට පවසන ශ්‍රමණ බ්‍රාහ්මණයන් ලෝකයෙහි ඇති බව (බුදු පසේබුදු මහරහත් මගඵලලාභී ආදී උතුමන්) පිළිගන්නවා.

## රැස් කරන පින් පසුපසින් ම එයි

මෙම පිළිගැනීම් නොමැති කෙනා මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළා.

එමෙන්ම සම්මා දිට්ඨිය තිබෙන කෙනා මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා දෘෂ්ටිය වශයෙනුත්, සම්මා දිට්ඨිය සම්මා දිට්ඨිය වශයෙනුත් වෙන්කොට හඳුනාගන්නා බවත් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළා. එහෙම පුද්ගලයා තමයි දන් දෙන්නේ. සිල් රකින්න උනන්දු වෙන්නේ. මෛත්‍රී කරුණාවෙන් යුක්ත වෙන්නේ. ඔහු සම්මා දිට්ඨියෙන් යුක්ත නිසා මානුෂික ගුණධර්මයන්ගෙන් යුක්තව ජීවිතය යහපත් ආකාරයට ගොඩනඟා ගන්නවා. එවිට රැස්වෙන පින ජීවිතයට සැප සලසා දෙනවා. මතු ජීවිතය සුගතිගාමී වෙනවා.

එමෙන් ම ධර්මාවබෝධයට උවමනා කරන මූලික පදනම ජීවිතය තුළ ගොඩනැගෙනවා.

දෙවැනි සම්මා දිට්ඨිය වන ලෝකෝත්තර සම්මා දිට්ඨිය. ඒ ගැන විග්‍රහ කර ඇත්තේ ආර්ය වූ, ආශ්‍රව රහිත වූ, ලෝකෝත්තර වූ, මාර්ග අංගයක් විදිහට දියුණුවන සම්මා දිට්ඨිය යනුවෙනු යි. එය භාග්‍යවතුන් වහන්සේ විස්තර වශයෙන් වදාළේ මෙහෙමයි. "ආර්ය වූ සිත් ඇති, අනාශ්‍රව සිත් ඇති, ආර්ය මාර්ගයෙන් යුක්ත වූ, ආර්ය මාර්ගය ප්‍රගුණ කරන කෙනකුගේ යම් ප්‍රඥාවක් ඇද්ද, ප්‍රඥා ඉන්ද්‍රියයක් ඇද්ද, ප්‍රඥා බලයක් ඇද්ද, ධම්මවිචය සම්බොජ්ඣංගයක් ඇද්ද, සම්මා දිට්ඨි මාර්ගාංගයක් ඇද්ද, මහණෙනි, මෙයට කියන්නේ ආර්ය වූ, ආශ්‍රව රහිත වූ, ලෝකෝත්තර මාර්ග අංගයක් වූ සම්මා දිට්ඨිය කියලයි."



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක
**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

ඒ ශ්‍රාවකයා චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න ම යි චින්තනය මෙහෙයවන්නේ. ප්‍රඥා ඉන්ද්‍රිය කියා කියන්නේ, අවබෝධය තමන්ගේ ජීවිතයේ ම අංගයක් බවට පත් වුණා ම යි. එය වඩාත් බලවත් බවට පත් වුණා ම ප්‍රඥා බලය කියා හඳුන්වනවා. ආර්ය සත්‍යාවබෝධය පිණිස, ධර්මයට අනුව වීමංසන බුද්ධිය මෙහෙයවනවිටයි මේ ලෝකෝත්තර සම්මා දිට්ඨිය හෙවත් චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධ ඤාණය ඇතිවන්නේ.

භාග්‍යවතුන් වහන්සේ වදාළා මේ ලෝකෝත්තර සම්මා දිට්ඨිය තුළින් තමයි මිථ්‍යා දෘෂ්ටිය සම්පූර්ණයෙන් ම ප්‍රහාණය කරන්නේ කියා. ලෝකෝත්තර සම්මා දිට්ඨියේ පිහිටා මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහාණය කරන්නට නම් වීර්යය අවශ්‍ය යි. එම වීර්ය සම්මා වායාම මාර්ග අංගය යි. එමෙන්ම මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහාණය කර සම්මා දිට්ඨියට පැමිණීම පිණිස පවත්වන සිහිය සම්මා සතිය යි. එසේ මේ මාර්ගයේ දී සම්මා දිට්ඨිය, සම්මා වායාම, සම්මා සති යන අංග තුන අත්වැල් බැඳගෙන පවතින බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළා.

**ලෝකෝත්තර සම්මා දිට්ඨියේ පිහිටා මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහාණය කරන්නට නම් වීර්යය අවශ්‍ය යි. එම වීර්යය සම්මා වායාම මාර්ග අංගය යි. එමෙන්ම මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහාණය කර සම්මා දිට්ඨියට පැමිණීම පිණිස පවත්වන සිහිය සම්මා සතිය යි.**

## සම්මා දිට්ඨිය ලොව්තුරු නිවනට මඟ සාදයි

සංයුත්ත නිකායේ කච්චානගොත්ත නම් සූත්‍ර දේශනාවේ දී ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඇතිවෙන ආකාරය භාග්‍යවතුන් වහන්සේ ඉතාමත් රමණීය අයුරින් පෙන්වා දී තිබෙනවා.

මෙහි දී කච්චානගොත්ත නම් ස්වාමීන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ විමසා සිටියා.

"ස්වාමීනී, සම්මා දිට්ඨිය, සම්මා දිට්ඨිය කියා කියනවා. ස්වාමීනී, සම්මා දිට්ඨිය ඇති වන්නේ කොපමණකින් ද?"

භාග්‍යවතුන් වහන්සේ මෙසේ පිළිතුරු දී වදාළා.

"පින්වත් කච්චාන, මේ ලෝක සත්වයා බොහෝ සෙයින් ම (මරණින් මතු ස්ථිර වූ පැවැත්මක්) තිබෙන බවක් ද (මරණින් මතු සත්වයා නැති වී උච්ඡේදයට පත් වී) නැති වී යන බවක් ද කියන මත දෙක ඇසුරු කරගෙනයි ඉන්නේ. එනමුත් කච්චාන, (ජීවිතය නම් වූ මේ) ලෝකයේ හටගැනීම ඒ ආකාරයෙන් ම දියුණු කරපු ප්‍රඥාවකින් දකිද්දී ලෝකය පිළිබඳ යම් නැති වී යාමක් ගැන මතවාදයක් තිබේ නම් ඒ මතය නැති වී යනවා.

මෙම සූත්‍රයේ දී භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙන්නේ යම් කෙනෙක් පටිච්චසමුප්පාදයේ හටගැනීම දියුණු කරන ලද ප්‍රඥාවෙන් අවබෝධ කළොත් 'මරණින් මතු මේ කිසිවක් නැත' යන උච්ඡේද දෘෂ්ටිය ඔහු තුළින් ප්‍රහාණය වන බවයි. භාග්‍යවතුන් වහන්සේ තවදුරටත් දේශනා කොට වදාළා.

"එමෙන්ම පින්වත් කච්චාන, (ජීවිතය නම් වූ මේ) ලෝකයේ නිරුද්ධ වීම ඒ ආකාරයෙන් ම දියුණු කරපු ප්‍රඥාවකින් දකිද්දී ලෝකය තිබෙන බවක් පිළිබඳ යම් මතයක් තිබේ නම්, ඒ මතය නැතිවෙලා යනවා"

එනම් පටිච්චසමුප්පාදයේ නිරෝධය දියුණු කරන ලද ප්‍රඥාවෙන් අවබෝධ

වීම තුළ, මරණින් මතු සදාකාලික පැවැත්මක් ඇත යන ශාස්වත දෘෂ්ටියත් ප්‍රහාණය වී යයි.

"පින්වත් කච්චාන, මේ ලෝක සත්වයා බොහෝ සෙයින් ම ලෝකය තුළ බැසගෙන, එයට ම බැඳී, එහි ම ගැලී, එයින් ම බැඳී ගිහිල්ලයි සිටින්නේ. ඉතින් ඒ ආකාරයෙන් ලෝකය තුළ බැසගෙන, එයට බැඳී, සිතින් අදිටන් කරගෙන එහි ම ගැලී, ඒ තුළ ම සිටින්නේ නැත්නම්, බැඳී යන්නේ නැත්නම්, 'මගේ ආත්මය' කියා අදිටන් කර ගන්නේ නැත්නම් උපදින විට උපදින්නේ දුකක් ම බවත්, නිරුද්ධ වන විට නිරුද්ධ වන්නේත් දුක බවත් යන මේ කරුණ සැක කරන්නේ නැත්නම්, විචිකිච්ඡා කරන්නේ නැත්නම්, ඒ ගැන මනා ව බාහිර උපකාරයකින් තොර වූ අවබෝධයක් තියෙනවා. පින්වත් කච්චාන, මෙපමණකින් ම සම්මා දිට්ඨිය ඇතිවෙනවා."

ඉතිරි කොටස 07 පිටුවට ...



## නිකිණි පෝය දා



සමයක් නිසා වැසි වැඩි මතු තුන් මාසේ
රුක්මුල් අසල ඇතිවන සීතල දැඩි සේ
අපහසු නිසා කරනට බණදම් රිසි සේ
එකතැන විසීමට දුන්නා බුදු උපදේසේ

පෙරවස් වසන්නට තිබුණත් පෝයට ඇසළ
මඟහැරුනොතින් සඟරුවනට ලැබුමට සීල
පසුවස් වසන්නට පොහොදින විසුල
නිකිණි පෝය දා සිදුවෙයි විලසින් පතළ

දෙසුදම් සයුර අපෙ සම්මා සම්බුදු හිමි
මතකයෙ තබාගත් මැනවින් නැතුව නිමි
ලැබුවේ රහත් භාවය බිඳ සසර බැමි
නිකිණි පෝයදා මහ ආනන්ද හිමි

සම්බුදුරදුන්ගේ මහ පරිනිර්වාණෙන්
තෙමසක් ගෙවුණු දා මහ කසුප් තෙරුන්
මුල්තැන අරන් අජාසත් රජු අනුග්‍රහයෙන්
නිකිණි පෝය දා කළේ සංගායනේ මුලින්

**ඒ.එම්.අබේසිංහබණ්ඩා**
**මාපනාවතුර මහනුවර**

*05 පිටුවෙන් ...*

ගහකොළ වැල මලින් එලදාවෙන් බර වෙයි. දසරාජ ධර්ම අංග පරීක්ෂා කරන විට එහි පළමු අංගය වන දානය ගැන බැලීමේ දි නිර්ලෝභී පාලකයකු තෘෂ්ණාබරිත නොවී ජන සමාජයේ උන්නතිය ගැන සිතන්නකු බවට පත්කරයි.

ජනතාව වෙනුවෙන් පරිත්‍යාගශීලිවීම, බුදුරදහු දසරාජධර්මයේ තුන්වැනි අංගයෙන් අවධාරණය කළ සේක. අවංක විශ්වාසනීය පාලකයාට ජනතාව අවනත ය. ගෞරවයෙන් යුතුව පාලකයාගේ වදනට නැමෙන යටත් වැසියන් ඇති සමාජය තුළ සාමජ නොසන්සුන් බව පැන නොනඟී. රජුගේ ඍජු බව ඊට හේතු වෙයි.

එසේම රජතුමා දයාන්විත හදින් කාරුණිකව ජනතා වුවමනාවන් තෘප්තකර දිය යුතු වෙයි. දරදඬු පිළිවෙත් හැරදා සෞම්‍යව මුදු මොළොක් සංවේදී හදින් ජනතා සිතුම් පැතුම් දැන ජන හිතකාමීව රජය කරවීමට බුදුරදුන් පෙන්වූ මුදුගුණය පාලකයකු තුළ පැවතිය යුතු මූලිකාංගයකි. සුබෝපභෝගි නොවී ආත්ම දමනයෙන් යුතුව සරල චාම්, ආදර්ශවත් දිවිපෙවෙතක් රජුගෙන් විද්‍යමාන වෙයි නම් එය රජුගේ තපෝ ගුණයයි. සතුරන් කෙරෙහි වුව මිත්‍රශීලීව මේ අපේ සමාජයේ අය ය. නොමඟ ගියද මේ අපේ දරුවෝය. සමාජයේ කොටස් ය යන හැඟීමෙන් නොමඟට වැටුණු අය වෙත්නම්, එසේ නොමඟ ගියවුන් සුමඟට ගනී.

බුදුන් වහන්සේගේ මේ ඉගැන්වීම් ඇතුළත හද සන්තානයෙන් පිළිගෙන අනුගමනය කරයි නම් එබඳු පාලකයන් ද, එවැනි සමාජය ද දින දින පුරසඳ සේ වැඩෙයි. අක්‍රෝධය, අවිහිංසාව යන දසරජ ධර්ම අංග තුළින් ඒ බැව් මැනවින් පෙන්වා දෙයි. කෝපවීම, නොඉවසීම බැහැරකර කවර දුෂ්කර අවස්ථාවක දී වුව ඥානවන්තවැ රටත් ජනතාවත් ආරක්ෂා කර ගැනීමට ඉවසුම් ගුණයෙන් යුතු පාලකයා වගබලා ගනියි.

සෑම විටම ජනතා සිතුම් පැතුම් දැන ඒවා තෘප්ත කර දීමට වෙර මහන්සියෙන් දූරදර්ශීව ක්‍රියාකිරීම ප්‍රඥා සම්පන්න පාලකයාගේ ස්වභාවයයි. අද මෙන් සන්නිවේදන තාක්ෂණික මෙවලම් නොවූ පෙර රජදවස ප්‍රඥාසම්පන්න රජවරු වෙස් වළාගෙන රට තුළ සැරිසැරුවේ සැබෑ ජනතා සිතුම් පැතුම් ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂව ම දැන කියා ගැනීමට ය.

පුද්ගලයාගේ ඉහමොළ විකලත්වයට වැට බැඳීම විනා ඊට අනුග්‍රහ දී මත්ද්‍රව්‍යයෙන් ජනතාව මත් කිරීම බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිගත් පාලකයාගේ පිළිවෙත නොවෙයි. පන්සිල් තුළින් ජීවත්වීමේ අයිතිය, දේපළ අයිතිය, සුරක්ෂිත වන්නා සේ ම පන්සිල් රැකීම අභය දානමය පින්කමකි. අවෛරී මානසිකත්වයෙන් ඉන් සත්වග සුවපත් කරයි. පවුල් සංස්ථාවේ පාරිශුද්ධත්වය ද, දරු පරපුරේ අනාගත සුරක්ෂිත බව ද තහවුරු වෙයි. සත්‍යය මත පදනම් වූ සමාජ සංස්ථාවේ උතුම් මිනිස් ධර්මතා පන්සිල් මත වූ පාලන ව්‍යුහය තුළින් මොනවට සුරක්ෂණය කරයි.

බුද්ධදාස රජු ගෙඩියකින් පීඩිත නාගයකු සුවපත් කරවා නාගයා ත්‍යාග කළ නාග මිණ ද අබාගිරි වෙහෙර සලපිළිමයෙහි නේත්‍ර පිණිස පූජා කළේ ය. දුගී මගියාට තම හිස දන් දී සමාජයක සුරක්ෂිත බව තහවුරු කළේ සංඝබෝධි රජාණෝ ය. මේ සියලු අනගිභවනීය ප්‍රතිලාභ බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සජීවිකරණය කිරීම තුළිනි. ප්‍රජාතන්ත්‍රවාදය, රාජ්‍ය පාලන මූලිකාංග වර්තමානයේ බොහෝ හුරුපුරුදු මානව හිමිකම් ප්‍රභවයට සම්භවයට බුදුදහමින් ලත් ආභාසය කිසිදා බැහැර කළ නොහැකි වෙයි. මානව හිමිකම් අභිබවන දෘශ්‍ය අදෘශ්‍ය සකල සත්වග අයිතිවාසිකම් බුදුපියාණෝ කරණීය මෙත්ත සූත්‍රයෙන් තහවුරු කළ සේක.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද පිළිගෙන ඇති සමානාත්මතාවේ අයිතිය අර්ථය අතින් වෙනස්වුවද එහි පැනනැඟීමට බුදුදහමේ සතර සංග්‍රහ වස්තූහි සමානාත්මතාව මැනවින් පිහිට වී ඇත. බණමඩුවේ සමානත්මතාව ඉක්මවන සමානාතාවක් අන් කවර තැනකදීවත් දැකගත නොහැකි වෙයි.

"මහ රජ ඔබ මේ පොළොවෙහි භාරකරු මිස අයිතිකරු නොවෙයි". එදා මිහිඳු මහ රහතන් වහන්සේ මිස්සක පව්වේ දී දේවානම්පියතිස්ස මහ නිරිඳුන්ට කළ ප්‍රකාශය රාජ්‍ය විචාරීම පිණිස ද, මහජන භාරය සංකල්පය, කුළුගැන්වීමට කළ අගනා සිහි කැඳවීමකි. මෙවන් ආකාරයෙන් රාජ්‍ය පාලනය උදෙසා බුදුන් වහන්සේගේ සාර්ව භෞමික , සාර්ව කාලීන, සාර්ව ජනීන ඉගැන්වීම් මත පිහිටා පාලකයෙක් ක්‍රියා කෙරෙත් ද එබඳු රාජ්‍යයක සාමකාමී බව හා සහජීවනය රටේ සමෘද්ධියට මඟ පාදයි.

*06 පිටුවෙන් ...*

## නිවනට ක්‍රම දහසයක්...

මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රයේ දී ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ ධර්ම සේනාධිපති සාරිපුත්ත මහරහතන් වහන්සේ සම්මා දිට්ඨිය ඇතිවන ක්‍රම දහසයක් පෙන්වා වදාළා. එහි ප්‍රථම කාරණය සාරිපුත්තයන් වහන්සේ දේශනා කළේ මේ ආකාරයට යි.

"ප්‍රිය ආයුෂ්මතුන් වහන්ස, යම් දවසක ආර්ය ශ්‍රාවකයා, අකුසල් ගැන දන්නවා නම්, අකුසල් මුල් ගැනත් දන්නවා නම් කුසල් ගැන දන්නවා නම්, කුසල්වල මුල් ගැනත් දන්නවා නම් එපමණකින් ම ප්‍රිය ආයුෂ්මතුනි, ආර්ය ශ්‍රාවකයා සම්මා දිට්ඨියෙන් යුක්ත වෙනවා. ඔහුගේ ආකල්පය ඍජු වෙනවා. මේ සද්ධර්මය කෙරෙහි නොසෙල්වන ප්‍රසාදයකින් යුක්ත වෙනවා. මේ සද්ධර්මය වෙත

ම පැමිණුන කෙනෙක් වෙනවා." මෙම දේශනාව විස්තර වශයෙන් දැනගැනීම පිණිස මජ්ඣිම නිකාය 1 පොත් වහන්සේගේ සම්මා දිට්ඨි සූත්‍රය කියවන්න. චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධ ඤාණය ඇතිකර ගත් කෙනා ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණෙනවා.

එලෙස මාර්ගයට පැමිණි කෙනා සෝතාපන්න යි. එහෙම නම් සෝවාන් වුණා කියන්නේ චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධ ඤාණය ඇති වීම යි. වෙනත් ආකාරයකට කිව්වොත් ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඇතිකර ගත් කෙනා සෝතාපන්න ආර්ය ශ්‍රාවකයෙක් වෙනවා. සම්මා දිට්ඨිය ඇතිවීම පිණිස කරුණු දෙකක් උපකාරී වන බව ධර්මයේ සඳහන් වෙනවා. ඒ සද්ධර්ම ශ්‍රවණය සහ යෝනිසෝ මනසිකාරය යි.

### සද්ධර්ම ශ්‍රවණය

සම්මා දිට්ඨියෙහි පිහිටන්නට නම්, මුලින් ම ධර්මය ශ්‍රවණය කළ යුතු වෙනවා. ඒ ශ්‍රවණය කළ යුත්තේ බුදුරජාණන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය යි. තර්ක, විතර්ක, පුද්ගලික මතවාද, ධර්මය මෙන් පෙනෙන අධර්මය ශ්‍රවණය කළාට සම්මා දිට්ඨිය ඇතිනොවන බව අප සිහි තබාගත යුතු ම යි.

### යෝනිසෝ මනසිකාරය

පැහැදිලි ලෙස, පිරිසිදු ලෙස දේශනා කොට වදාළ ඒ ශ්‍රී සද්ධර්මය අසා කියවා සිතෙහි පිහිටුවාගෙන එය තේරුම් ගැනීම පිණිස නුවණ මෙහෙයවීම යෝනිසෝ මනසිකාරය යි. එසේ ධ ර්මයට අනුව නුවණින් විමසීම සම්මා දිට්ඨිය ඇතිකර ගන්නට අතිශයින් ම උපකාරී වෙනවා.

## අසරණ මවක්
## බුදුසරණ පුවත්පතට යොමු කළ ලිපියකිනි

අගලවත්තේ ස්වර්ණගමේ පදිංචි නිලානි පතිරාජ නමැත්තිය බුදුසරණට යොමු කර ඇති ලිපියකිනි මේ.

ඇයට දරුවන් දෙදෙනෙක් සිටින බව කියයි. ලොකු පුතා කවිෂ් මධුසංඛ අවු. 15 යි. අගලවත්ත මිහිඳු විදුහලේ 11 වසරේ ඉගෙනුම ලබනවා. පොඩිපුතා අගලවත්ත දාපිළිගොඩ විද්‍යාලයට 3 වසර තෙක් පාසල් ගියා. ඒ අතරේ උණ වැඩි වී ස්නායු දුර්වලවීමෙන් දරුවා ආබාධිත තත්ත්වයට පත් වූ බව ද කියයි. 2014 වර්ෂයේ සිට දරුවා මේ විදිහ බවත් දැනට අවුරුදු 5ක් වෙන බවත් ඇය කියයි.

අවුරුදු 4 1/2 ක් දරුවා බටයෙන් සුප් ටික, පිටි වතුර ටික විතරයි දුන්නේ. කිසිම ක්‍රියාකාරකමක් නැතිව සිටියේ. දැනට මාස 5 කට කලින් දරුවගේ බට අයින් කර කටින් කවනවා. පොවනවා. දරුවා හිනහා වෙනවා. දරුවා සුවවෙන කාල සීමාවකුත් නෑ. දරුවා බොරැල්ලේ ළමා රෝහලට මාස් පතා රැගෙන යනවා." යැයි ඇය පවසයි.

ඇය ජීවත් වෙන්නේ, දරුවට මාසයකට ලැබෙන ආබාධිත ආධාර මුදල වන රුපියල් 3000 හා සමෘද්ධි ආධාර රු. 2000/- න්, තේ දළු ටිකෙන් ලැබෙන සුළු මුදලෙන් බව කියයි. දරුවාට කැප වී සිටීම නිසා මවට ද රැකියාවක් කර ගැනීමට අපහසු බව කියයි. දරුවන්ගේ පියා ඔවුන් අතහැර වෙන්ව ජීවත් වෙන බවත් අවු. 5 ක් තිස්සේ තමා තනිව දුක විඳින බවත් කියයි.

ලොකු පුතා ඉගෙන ගන්න කැමැති බවත් ඉගෙන ගන්න පුළුවන් බවත් ඇය කියයි. මේ අවුරුද්දේ සාමාන්‍ය පෙළ ලියන බවත් පන්ති ගාස්තු ගෙවන්නේත් හරිම අමාරුවෙන් බවත් කියයි.

මේ දරුවා ලොකු මහත්වෙන්නේ ද ඇඳමත බවත් මොනවා හරි දෙයක් කර මේ දරුවා පුටුවක වාඩි වී සිටීමේ තත්ත්වයට හෝ ගෙන ඒම ඒ මවගේ උත්සාහය බව පවසයි. පරිත්‍යාගශීලීන්ගේ අවධානය යොමු කරන මෙන් ඇය කාරුණිකව ඉල්ලා සිටියි. ලිපිනය නිලානි පතිරාජ, ස්වර්ණගම බේරගම, අගලවත්ත 0771714725 දුරකතනයෙන් වැඩි විස්තර විමසිය හැකි බව කියයි. ලංකා බැංකුව අගලවත්ත, ගිණුම් අංකය 343952 ආධාර කළ හැකි බව ද කියයි

# අඥාන වුණොත් දුක ද සැපයක් සේ දකිනවා



මහව,උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි ප්‍රධානාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**

**අපේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ලෝකය හා සත්වයා පිළිබඳ අතැඹුලක් සේ අවබෝධ කර ගත් ශාස්තෘවරයෙකි. උන්වහන්සේ ඒ පිළිබඳ ව පැහැදිලි ව කරුණු කාරණා දේශනාකොට ඇත. මෙම සංසාරය මොනතරම් දීර්ඝ ද? එහි සැරිසරන සත්වයා මොන තරම් දුක් විඳිනවා ද? යන වග උන්වහන්සේ තම ඥාන ශක්තියෙන් ම අවබෝධ කොට ගෙන ලෝක සත්වයාට දේශනා කළහ. එහි ගැඹුරු බව හා දුක් සහගත ස්වභාවය බුදු ඇසකට ම විනා පුහුදුන් මනසකට අවබෝධ නොවේ.**

බුදුරජාණන් වහන්සේ සං:නි: අස්සු (අස්සුපම) සූත්‍රය තුළින් දේශනා කරන්නේ "අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති. අවිජ්ජානිවාරණානං සත්තානං තණ්හා සංයෝජනානං සන්ධාවතං සංසරතං දීඝරත්තං වො භික්ඛ වේ දුක්ඛං පච්චනුභූතං" යනුවෙනි.

එනම් "සසර" කාල වශයෙන් අතීත කෙළවර සිහිපත් කළ නොහැක. එබැවින් සසර අතීතයට ගොස් පැනවිය නොහැකි ය. අවිද්‍යා නීවරණයන් ආවරණය වූ තණ්හා සංයෝජනයෙන් නුඹලා දිගු කලක් දුක් අනුභව කර ඇත.

මේ දේශනයෙන් පැහැදිලි වන්නේ සංසාරයේ මුල අග අපහැදිලි බව නොවේ ද? ඒ තරමට ම සසර දීර්ඝ ය. බුදුරජාණන් වහන්සේ අලව් නුවර පේසකාර දියණියගෙන් ඇසූ ප්‍රශ්නත් සමඟ සසරේ දීර්ඝ ස්වභාවය පිළිබඳ ව යම් අවබෝධයක් ලබා ගැනීමට පුළුවන. එම සංවාදය ධම්ම පදයේ ලෝක වග්ගයට අයත් 8 වැනි ගාථාවට අයත් නිධාන කතාව තුළින් පැහැදිලි වේ.

**බුදුහිමි** : ළදැරියනි, නුඹ කොහි සිට ආවා ද?
**පේසකාර දියණිය** : බුදුරජාණන් වහන්ස, මම නොදනිමි.
**බුදුහිමි** : ළදැරියනි, නුඹ කොහි යන්නී ද?
**පේසකාර දියණිය** : බුදුරජාණන් වහන්ස. මම නොදනිමි.
**බුදුහිමි** : ළදැරියනි, නුඹ නොදන්නේ ද?
**පේසකාර දියණිය** : බුදුරජාණන් වහන්ස, මම දනිමි.
**බුදුහිමි** : ළදැරියනි නුඹ දන්නේ ද?
**පේසකාර දියණිය** : බුදුරජාණන් වහන්ස, මම නොදනිමි.

මෙම සංවාදය බැලූ බැල්මට එදිනෙදා භාවිත කරන භාෂා ව්‍යවහාරයක් සේ පෙනුණද මෙහි අන්තර්ගතය ඉතා ගැඹුරු ය. බුදුහිමි ඇසූ ප්‍රශ්නවලට පේසකාර දියණිය ද පිළිතුරු ලබා දෙන්නී අවබෝධයෙන් ම යි. ආපු තැන නොදන්නා බව යනු දැනට ලබා ඇති ජීවිතයට පෙර කොහි සිටියා ද? යන්නත්, යන තැන නොදන්නා බව යනු මේ ජීවිතයෙන් පසු කොතැනක ඉපදේ ද යන්නත් පිළිබඳව ය. එසේ නම් මෙම සංසාරය කොතරම් දීර්ඝ ද?

අප ඉපදී ඇති වාර ගණන අනන්ත ය. අපට ඉපදෙන්නට තිබෙන වාර ගණන ද අනන්ත ය. දිගු ගමනක යෙදී ඇති අප උසස් ආත්මයක ඉපදී ඇත. කෙටි කාලයක් තුළ ජීවත් වීමට අවස්ථාවක් ලද සත්වයා ගත කරන ජීවිතය යනු දිගු ගමනක පුංචි විවේකයක් ලබා ගත්තා හා සමාන නොවේ ද?

එම දිගු ගමන තුළ සත්වයා අමනාප සංයෝග, මනාප වියෝග, මාතෘ මරණ, පීතෘ මරණ, සොයුරු මරණ, සොයුරි මරණ, පුත්‍ර මරණ, දුහිතෘ මරණ, ඥාති ව්‍යසන, භෝග ව්‍යසන. රෝග ව්‍යසන යනාදී දුක්වලට පත් නොවුණා නොවේ ද? සං:නි අනමතග්ග සංයුක්තයෙ පඨම වග්ගයෙ අස්සුපම සූත්‍රය තුළින් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ එම දිගු ගමන තුළ හෙළූ කඳුළු පමණක් මහ සයුරට වැඩි මිස අඩු නොවන බව ය.

ඒ නිසා ම සියලු සංස්කාරයන් කෙරෙහි නිර්වේදයට පැමිණීම සුදුසු බවත්, විරාගයට පැමිණීම සුදුසු බවත්, මිදීම සුදුසු බවත් දේශනා කොට ඇත.

සසර හරියට චක්‍රයක් හා බඳු ය. එනිසා ම සංසාර චක්‍රය යනුවෙන් ආමන්ත්‍රණය කරනු ඇත. කැරකෙන රෝදයකට හසු වුණා සේ නිමක් නොමැති සංසාර චක්‍රයට සත්වයා හසු වී ඒ ඒ ආත්ම භවවලට හසු වෙමින් ගමන් කරනු ඇත. දීර්ඝ සංසාර චක්‍රය යනු ත්‍රිවිධ ලෝකයෙහි සැරි සැරීමයි. එනම් කාම, රූප, අරූප යන ලෝකයන්ට හසු වීමයි. මෙහි දී ලෝක යන වචනය පිළිබඳ බුදුහිමි විග්‍රහ කර ඇති ආකාරය විමසා බැලීමේ දී තවත් ඒ පිළිබඳ අවබෝධ වේ.

- සත්ව ලෝකය (කාමයෙහි ඇලෙන බැවිනුත්, පංචස්කන්ධය දරන බැවිනුත්, සත්ව ලෝකය නම් වේ)
- ඕකාස ලෝකය (එම සත්වයිනට පිහිටා සිටීමට ආධාර වූ භෞතික ලෝකය)
- සංඛාර ලෝකය (ඉහත ලෝක දෙකම හට ගැනීමට හේතු වූයේ රූප, වේදනා ආදී ස්කන්ධ ධර්මයන් ද, කුසලාකුසල කර්මයන් ද එයට ඇතුළත් වේ.)

මේ ආදී විග්‍රහ තුළින් ලෝකය තුළ ද ප්‍රභේදයන් දක්නට ලැබෙන බව සිහිය යුතු ය. කාමාවචර, රූපාවචර, අරූපාවචර යන ඒවා තුන් ලෝක වශයෙන් ද, සිත් වශයෙන් ද විග්‍රහකොට ඇත. ඒ කෙසේ වෙතත් සංසාරය දීර්ඝ ය. එය දිව්‍ය, බ්‍රහ්ම, ප්‍රේත ආදී ලෝකවල ආයු කාලය අනුව ද, සත්වයා සසර හටගන්නා හා විනාශ වන්නා වූ ප්‍රමාණය අනුව ද සිතීමෙන් පැහැදිලි වේ. එවන් දීර්ඝ සංසාර චක්‍රයකට හසු වී සිටින සත්වයාට ඇති සැපතක් නැත. ඒ බව බුදුරදුන් ම:නි මහා තණ්හා සංඛය සූත්‍රය තුළින් මනාව විග්‍රහකොට ඇත.

යමෙක් ඇසින් රූපයක් දැක ප්‍රිය සහගත රූපයෙහි ඇලෙයි. අප්‍රිය සහගත රූපයෙහි ගැටෙයි. නොඑළඹී කය පිළිබඳ සිහියෙන්, පටු වූ සිතින් වසයි. පවිටු අකුසල ධර්මයන් නිර්වශේෂ වශයෙන් ප්‍රහාණයෙන් ලබන චේතො විමුක්තිය හා පඤ්ඤා විමුක්තිය ඇති සැටියෙන් නොදකියි. ඔහු මෙසේ එකඟතා හා විරුද්ධතාවන්ට පැමිණ සුඛ, දුක්ඛ හා අදුක්ඛමසුඛ වූ යම්කිසි වින්දනයක් පිළිබඳ සතුටු වෙයි. අභිවාදනය කරයි. සතුකර ගනියි. වින්දනය පිළිබඳ එසේ ගන්නා කල්හි සතුට උපදයි. යම් වින්දනයක්, පිළිබඳ ව සතුටු වේ නම් එය උපාදාන කර ගනියි. ඒ උපාදානය ප්‍රත්‍යයෙන් ජරා, මරණ, සෝක, පරිදේව, දුක් දොම්නස් හට ගනී.

මේ ආදී වශයෙන් සත්වයා සසර සැරි සරන්නේත්, ජීවිතය දුකට පත්වන්නෙත්, කෙටියෙන් කියතොත් පටිච්ච සමුප්පාදය නොදැනීමෙන් ය. එදිනෙදා ජීවිතය තුළ තාවකාලික සැපතක් වින්දනය කළ ද එය ගිනි අවුලන තුරු සැලියෙහි පිහිනන කකුළුවකු හා බඳු ක්‍රියාවකි. පුංචි වේලාවක් තුළ සතුටක් ලබන සත්වයා බොහෝ වේලාවක් තුළ දුකක් ම විඳිති. කයින් හා මනසින් අනන්ත අප්‍රමාණ තාඩන, පීඩනවලට හසුවෙති. කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් අටලෝ දහමට ද මුහුණ දෙති. මැරීමේ ඉපදීමේ නිමක් නොමැතිව සසර සැරි සරති.

අන්ධ භූතෝ අයං ලෝකේ - තනුකෙත්ථ විපස්සති

සකුන්තො ජාල මුත්තෝව - අප්පෝසග්ගාය ගච්ඡති.

නුවණ නොමැති පුහුදුන් සත්වයා අන්ධයකු මෙනි. (ප්‍රඥාවෙන්) ඒ අතරින් ටික දෙනෙක් හෝ ලෝකය හා සත්වයා පිළිබඳ ඇත්ත ඇති සැටියෙන් දැක සුගතියට පැමිණෙති. නිරන්තරයෙන් මාරයාට හසු වී සිටින සත්වයා ඉන් මිදීමට නොසිතන්නේ අන්ධ බැවිනි. පංචකාමයෙන් අන්ධ වූ කල්හි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණයන් පිළිබඳව දැකීමද අපහසු ය. ඒ වෙනුවට නිත්‍ය, සුඛ, ආත්ම වශයෙන් දැකීමට උත්සාහවත් වෙති. එතුළින් අනන්ත අප්‍රමාණ දුක්වලට හසුවෙමින් දීර්ඝ සංසාර චක්‍රයට හසු වී සත්වයා ගමන් කරනු ඇත.

නිරන්තරයෙන් මරුට වසඟ වී සිටින සත්වයා ඉන් මිදීමට ඇති මඟ පිළිබඳ ව සිතිය යුතු ය. තමාට තමාවත් නොමැති ලෝකයක දැඩි උපාදානය කරපින්නාගත් සත්වයා සිදු කරන බහුනාටක තුළින් සිදු වන්නේ තම අඥානකම ප්‍රදර්ශනය කිරීමකි. ඒ අනුව අනන්ත අප්‍රමාණ දුක් කන්දරාවක නිමග්නව සිටිමින් වුව ද එය සැපක් යැයි සිතීමට තරම් සත්වයා අඥාන වී ඇත.

කරවිල ගෙඩියේ පණුවට තිත්තත් පැණි රසක් සේ සත්වයාට ද දුක ද සැපක් බඳු ය. අන්ධ බවින් මිදී ප්‍රඥාලෝකය පහළ කරගත් කල්හි සැබෑ යථාර්ථය දැකීමට අපහසු නොවනු ඇත. ඒ සඳහා සැමටම ප්‍රඥා ඇස පහළ වේවා.



# කරදියත් මිහිරි පැන් කරන පින් සිතක මහිමය





දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**දුටුගැමුණු මහරජතුමා දසමහා යෝධයනුත්, සෙසු යුද සේනාවත් සමග සතුරන්ට විරුද්ධව සටන් කළා. අවසානයේ ලංකා රාජ්‍යය එක් ධජයක් යටතට ගත්තා. යුද්ධයට සහාය වූ, නායකත්වය දුන් හැම කෙනකුට ම රාජ්‍ය වරප්‍රසාද වශයෙන් තෑගි භෝග, ගම්වර සහ තනතුරු ආදිය පිරිනැමුවා.**

රජතුමාට බොහෝ සේ සෙනෙහස දැක් වූ, ආරක්ෂාව සැපයූ, කෑම බීම් ආදිය කෙරෙහි විශේෂ සොයා බැලීම් කළ විශ්වාසවන්තම රාජ්‍ය සේවකයෙක් හිටියා. ඔහුගේ නම තිස්ස.දවසක් රජතුමා පාන්දරින් ම අවදි වෙලා කණ්ඩුල ගැන සොයා බැලුවා. එවිට දැක්කා පය බැඳි යදමත්, බැඳ සිටි කඹයත් බිඳගෙන ඇත්හලින් පැනගොස් බව.

දින ගණනක් ගත වුවත් රජතුමාට කණ්ඩුල ගැන කිසිම ආරංචියක් ලැබුණේ නෑ. දවසක් තමන්ට විශ්වාසවන්තම රාජ්‍ය සේවකයා වන තිස්ස උපස්ථායක කැඳවලා

'තිස්ස මම ලොකු වේදනාවකින් මේ දවස් කිහිපය ම ගත කළේ. මගේ පණ වගේ සිටිය කණ්ඩුල ගිය දිසාවක් තවමත් සොයා ගන්න නෑ. මට කොහොම හරි කණ්ඩුල සොයලා දෙන්න" යැයි ප්‍රකාශ කළා.

ඔහු මහා කැලෑ මැදින් දින ගණනක් ඇවිද ගියා. ඇත් අඩි ඔහුට හොඳින් හඳුනා ගන්න පුළුවන් වුණා. ක්‍රමයෙන් ඔහු ළඟා වුණේ මහානිජ්ඣර නම් අරණ්‍ය විහාරයකටයි. බැලු බැලූ අත දර්ශනය වුණේ භාවනායෝගී භික්ෂූන් වහන්සේ යි. සමහර භික්ෂූන් වහන්සේ රුක්මුල්වල වැඩ සිටිමින් භාවනාවේ යෙදී සිටියා. තවත් කෙනෙක් අභ්‍යවකාශය අරමුණු කරගෙන හිස් භූමියක වැඩ සිටිමින් භාවනා කරනවා දුටුවා.

මේ අයුරින් අසුභ භාවනාව, පංශුකුලිකංග භාවනාව, නීලපීතාදී කසිණ භාවනා, මරණානුස්මෘති, බුද්ධානුස්සති ආදී භාවනා, මෙන් ම මෛත්‍රී, කරුණා, මුදිතා ආදී භාවනාවල යෙදෙමින් වැඩ සිටිනු දුටුවා. සිල්වත් ව, ගුණවත්ව බුදුරජාණන් වහන්සේගේ අනුශාසනා පිළිපදිමින් වැඩ සිටින භික්ෂූන් වහන්සේට නමස්කාර කර එකත්පසක වැඩ සිටියා. ඒ අතර කණ්ඩුල ඉදුණු පලතුරු ආදිය අරගෙන විත් භික්ෂූන් වහන්සේට පිළිගැන් වුවා.

තිස්ස උපස්ථායක එය දැකලා පුදුමයට පත් වෙලා 'යදම් බිඳගෙන, කඹ සිඳගෙන, ගස්වැල් විනාශ කරමින්, මිනී මරමින් හැසුරුණු, දුටු පමණින් බියට පත් වන තරමේ චණ්ඩ කණ්ඩුල දැන් උපස්ථායකයෙක් වගේ භික්ෂූන් වහන්සේට සේවය කරනවා. වතාවත් කරනවා. ගුණවතුන් වහන්සේගේ ගුණය තිරිසන් සතුන් පවා හොඳින් හඳුනා ගන්නවා.

අනේ, බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේගේ ගුණ මහිමය ආශ්චර්යයි, උන්වහන්සේ අල්පේච්ඡයි., විවේකකාමීයි., සතුටින් දිවි ගෙවනවා, පිරිසුදු ජීවිත ගත කරනවා. මේ ගුණ දකින අයකුට ප්‍රීති උපදිනවා. කණ්ඩුලට වගේ ම මටත් ලොකු සතුටක් දැනෙනවා.

රජතුමාට මේ තොරතුරු ඉක්මනින්ම දැනුම් දෙනකම් මගේ සිතට ඉවසිල්ලක් නෑ' යි කල්පනා කළා.

කැලෑවේ බිහිසුණුකමවත් නො සිතා විහාරයට සම්පවීමට ගිය කාලයෙන් භාගයක්වත් ගතවීමට පෙර නැවතත් රජමාලිගයට පැමිණ ඔහු රජතුමාට සියල්ල පවසා සිටියා. රජතුමා උපස්ථායකයා අමතා

'තිස්ස, ඔබම නැවතත් ඒ විහාරයට ගිහින් කණ්ඩුල අරගෙන එන්න. ඔබට අවශ්‍ය දෑ අරගෙන යන්න' යැයි පවසා සිටියා.

රජතුමාගේ අණට කීකරු වූ තිස්ස උපස්ථායක පලතුරුත්, උක්සකුරුත් අරගෙන තවත් කිහිපදෙනෙක් සමග මහානිජ්ඣර ආරණ්‍ය විහාරයට ම ගමන් කළා. කණ්ඩුල වෙනදා වගේ ම උපස්ථාන කටයුතුවල යෙදී සිටියා.

තිස්ස උපස්ථායකගේ සිතෙහි අපමණ ශ්‍රද්ධාවක් පහළ වී තිබුණා. ඔහු ශ්‍රද්ධාසිතින් ම පලතුරු මිරිකා යුෂගෙන උක්සකුරු සමග භාවනායෝගී භික්ෂූන් වහන්සේට පූජා කළා.

සතුටු සිතින් කණ්ඩුලත් අරගෙන නැවත මාලිගයට පැමිණියා. හෙතෙම රජතුමාට අවශ්‍ය සේවය ලබා දී විශ්‍රාම සුවයෙන් ජීවත් වී කාලයාගේ ඇවෑමෙන් කළුරිය කළා. සිල්වත්, ගුණවත්, භාවනානුයෝගී භික්ෂූන් වහන්සේට පලතුරු යුෂ සමග උක්සකුරු පූජා කිරීමේ කුසලයෙන් මනුෂ්‍යය ලෝකයේ ම උපත ලැබීමේ භාග්‍යය උදා කර ගත්තා.

හෙළදිව උතුරු පෙදෙසේ අඹවිට නම් ගම මහත් ධනයකට හිමිකම් කියූ, උතුම් ගුණ ඇති කුලගෙයක උපත ලැබුවා. පෙර ආත්මයේ හිමි වූ නාමය ම මේ ආත්ම භාවයේත් හිමිවුණා.

ක්‍රමයෙන් වැඩිවියට පත් වී කුල කුමාරිකාවක් සමග විවාහ වුණා. කාමභෝගී සැප සම්පත් සිත් සේ වින්දනය කළා. තෙරුවන් වහන්සේගේ ධර්මය ඇසීමට ලැබීමෙන් සසර ස්වභාවය වටහා ගත්තා. බිරිඳට අවශ්‍ය සියලු සම්පත් ලබා දී අවසර ගෙන අවබෝධයෙන් ම ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වුණා. විහාරයේ වතාවත් නිසි අයුරින්, පිරිසුදුව, කැපවීමෙන් ඉටුකළා. කිසිදු අවස්ථාවක අතපසුවීමක් සිදු කළේ නෑ.

විහාරවාසී වැඩිහිටි තෙරුන් වහන්සේගේ ගෞරවාදරය දිනා ගත්තා. ඒ නිසාම 'ප්‍රතිපත්තිසාර තිස්ස නමින් හඳුන්වන්නත් පටන් ගත්තා. දවසක් විහාරවාසී තෙරුන් වහන්සේලාත්, උපාසකවරු කිහිපදෙනකුත් කතිකා කර ගත්තා දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීමට යාමට. දිනය උදා වුණා.

නැවෙන් මුහුද තරණය කරන්න පටන් ගත්තා. දින ගණන් මුහුදේ ගමන් කළා. දඹදිවට ගොඩවීමට දින කිහිපයක් තිබිය දීම බීමටත්, ඇඟපත සෝදා ගැනීමටත්, ඉවුම් පිහුම් කිරීමටත් ගෙන ගිය ජලය අවසන් වී තිබුණා.

තිස්ස තෙරුන් වහන්සේට ඉවසා ගත නොහැකි පිපාසයක් පැමිණ ජල බිඳුවක් හෝ හොයා ගැනීමට උත්සාහ කළා. එහෙත් උත්සාහය නිෂ්ඵල වුණා. අවසානයේ තීරණය කළා කරදිය බොන්න. නැවේ සිටි පිරිස එසේ නොකරන ලෙස ඉල්ලා සිටියත්, ඉවසිය නොහැකි පිපාසය නිසා පාත්‍රයට කරදිය අරගෙන බොන්න පටන් ගත්තා.

උන්වහන්සේ පෙර ආත්මයේ සිල්වත්, ගුණවත්, භාවනානුයෝගී භික්ෂූන් වහන්සේට පලතුරු යුෂ සමග උක්සකුරු පූජා කිරීමේ කුසලානිශංසයෙන් කරදිය අමෘතය මෙන් මිහිරි ජලය බවට පත් වුණා. තෙරුන් වහන්සේටත් අදහාගත නොහැකිව පුදුමයට පත් වුණා.

නැවේ සිටි හැම දෙනාට ම උන්වහන්සේ කරදිය පාත්‍රයට ගෙන මිහිරි ජලය බවට පත් කරමින් ලබා දුන්නා. ආහාර සකස් කර ගැනීම් ආදියත් කර ගනිමින් සුව සේ දඹදිවට වැඩම කර ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කරගෙන නැවතත් ලංකාද්වීපයට වැඩම කළා. එන ගමනේ දීත් එම පැන්ම අනුභව කළා.

එතැන් පටන් උන්වහන්සේ බොහෝ පින්කම් කර එයින් ගොස් දෙව්ලොව දොළොස් යොදුන් රුවන් මාලිගාවක දහස් ගණන් දෙවඟනන් පිරිවරාගෙන නැටුම් ගැයුම් වැයුම් සැප විඳින දිව්‍ය පුත්‍රයකු ලෙස උපන්නා.

සකුරුපැන් පූජා කිරීමෙන් මනුෂ්‍යලොව දී මනුෂ්‍ය සම්පත්, දෙව්ලොව දී දිව්‍ය සම්පත් නො අඩුව වින්දනය කළා.

සාපිපාසාවන් කිසිදු ආත්මයක උන්වහන්සේට ඇති වුණේ නෑ. දෙව්ලොව උපන් උන්වහන්සේ වෙනුවෙන් ම මිහිරි රසයෙන් පිරුණු පැන් පොකුණු පහළ වුණා. ඔහු සමීපයට එන දේවතාවෝ ඒවා පානය කළා. සන්තෝෂයෙන් නටමින්, ගී කියමින්, ක්‍රීඩා කරමින් විනෝද වෙමින් තම තමන්ගේ දිව්‍ය විමානවලට යාමේ පුරුද්දක් ද ඇති වුණා.

ඇතැම් දෙව් කෙනෙක් මිහිරි දිව්‍ය පැන් පුරවාගෙන ගෙන යන්න පටන් ගත්තා. මනුෂ්‍ය ලෝකයේත් මේ භාග්‍ය උදා කරගන්න මිනිසුන් දැක ගන්න පුළුවන්.

ඇතැම් අය සිටිනවා ජල සම්පත්වලින් සහ භවභෝග සම්පත්වලින් අඟහිඟකම් නැති. ඒ අය මෙවැනි පින්කම් කළ පිරිස් යැයි විශ්වාස කරන්න පුළුවන්.

ශ්‍රද්ධාවන්ත සිතින් තමන් විසින් උපයා ගත් සුළු දෙයක් හෝ ගුණයෙන්, සීලයෙන් උසස් උතුමන්ට පූජා කිරීමෙන් ප්‍රමාණය කළ නො හැකි දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලැබීමේ භාග්‍ය උදා කර ගත හැකියි.

# එළාර රජුගේ ව්‍යාජ ධර්මිෂ්ඨකම ජනතාවට පැහැදිලි කළ යුතුයි

දුටුගැමුණු මහ රජතුමා

76 කොටස

**මට පුණ්ණා දියණියගේ සහ උපතිස්සගේ විවාහ කටයුතු ඉවරයක් කර ගත්තොත් සැනසිල්ලේ ඉන්නට පුළුවන්. ඊළඟට සිතට බරක් තියෙන්නේ සිරිනාග පුතා ගැනයි. විමලී ජීවත් ව සිටියදීත් සිරිනාග හැදුවෙ මම. යුද පුහුණු කඳවුරකට යනතුරු මම පුතයි දුවයි දෙන්නා බලා ගත්තේ මගේ ඇස්දෙක වගේ. හරිම ආදරයෙන්.**

"දැන් ඔය ළඟටම වෙලා ඉන්නේ. සිරිනාගත් සමන්තීට හරිම ආදරෙයි."

මිත්‍රගේ මරණයෙන් පසු මට හිතුණේ දොරමඩලාව ගමේ අපේ ගෙදරට යන්නයි.අපේ සීයා අසේල රජුගේ ප්‍රධාන ඇමැති ලෙස සේවය කළා."

"එළාර අසේල යුද්ධෙ දී ඔහු මළා."

"මාත්, බෝධිනාගත්, අම්මාත් බයේ පැන ගියා. අපි මහියංගනයේ මාමා කෙනකුට අයත් හේනක ගොවිතැන් කරගෙන ජීවත් වුණා. අම්මාත් අකාලයේ මිය ගියා. ඒ අතර මිත්‍රත් මාත් අතර සම්බන්ධයක් ඇති වුණා. බෝධිනාග විරුද්ධ වුණා. ඒත් දෛවයට අනුව අපි අතර විවාහය සිදුවුණා. බෝධිනාග මගෙන් ඈත් වුණා. සුමන මහ සිටුතුමාගේ ගොවිපල බලාගන්න ඔහු ආවේ එයින් පසුවයි. අපට අයත් දොරමඩලාව ගමේ දෙමහල් ඇමති මන්දිරය දැන් බෝධිනාග අලුත්වැඩියා කරනවා. යුද්ධයෙන් පසුව අපි ඒ නිවසට යන්නයි අදහස."

සමන්තී තමන්ගේ අතීතය පැවසුවේ එළාර රජුගේ ආක්‍රමණවලින් සිංහලයන්ට සිදු වූ අතවර හා විපත්වලට නිදසුනක් වශයෙනි.

සිරිනාග අපටත් අපේම පුතෙක්. සිරිනාග නොසිටින්නට අපටත් අපේ අයියණ්ඩිට සුමන මහ සිටුතුමාට අත් වූ ඉරණම අත්පත් වෙන්නට තිබුණා. මිත්‍ර මහ සෙනෙවි සිරිනාග සමඟ වෛර බැඳ ගත්තෙත් අප ළඟින්ම සිටි නිසයි." මහ සිටුතුමා කීවේ ය.

"අම්තා සිරිනාගට අපටත් වඩා ආදරෙයි. සිරිනාගත් සමඟ යුද්ධයට යන්නටත් අවසර ඉල්ලනවා." සිටුදේවිය කීවා ය.

අද මාත්, බෝධිනාගත් සිතාගෙන ආවේ මේ දෙන්නා ගැන කතා කරන්නයි. සිරිනාගගේ හිත තුළත් අම්තා ගැන කැමැත්තක් ඇති බව ඔහුගේ කතාබහෙන් පෙනී ගියා."

"යුද්ධය අවසාන වන තුරු සිරිනාග විවාහයක් කර ගන්නට කැමති වෙන එකක් නැහැ."

"විවාහය ඔහුට බරක් නොවෙයි,

"කොහොම වුණත් අපි ඒ දෙන්නාගේ කැමැත්තට ඉඩ දෙමු." සිටු දේවිය කතාව නිම කළේ සිරිනාග එන බව දුටු නිසා ය.

"අම්තා යුද්ධයට යාමට සංග්‍රාමික පුහුණුවක් ලබනවා. තවත් තරුණියන් පනස් දෙනෙකු එකතු කරගෙන දැන් පුහුණුව අවසන් වෙන්නට ළඟයි."

කුණ්ඩල බ්‍රාහ්මණතුමා පැමිණියේ රාත්‍රී දහයට පමණ ය. සැවොම පැමිණ ගෝපුර ද්වාරයේ දී එතුමා පිළිගත්හ. රාජකීය උද්‍යානයේ සතුටු සාමීචියේ යෙදුණු ඔවුහු රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා භෝජනාගාරයට ඇතුළු වූහ.

භෝජන සංග්‍රහය ඉතා උසස් තත්ත්වයෙන් සූදානම් කර තිබිණි. සංග්‍රහය භුක්ති විඳි කාන්තාවෝ විචිත්‍රාගාරයට ගියහ. කුණ්ඩල බ්‍රාහ්මණතුමා පිරිවරාගත් සිටුතුමා, සිරිනාග, බෝධිනාග ආලින්දයට පැමිණ අසුන් ගත්හ. එලකයක් මත දැල්වුණු පහනින් ප්‍රසන්න ආලෝකයක් විහිදුවේ ය.

සිරිනාග ගැන සියලු තොරතුරු දැන සිටි කුණ්ඩල බ්‍රාහ්මණ ඔහුගේ ක්‍රියා කලාපය රටට දැයට හිතකර වීම ගැන සතුටට පත් විය. බෝධිනාග ගැන ඔහු හොඳින් දැන සිටියේ ය. සුමන මහ සිටුතුමාගේ ළඟම හිතවතා වූ ඔහු මුහුණ දුන් කරදර ද දැන සිටියේ ය.

"කුණ්ඩල බ්‍රාහ්මණතුමනි, ඊයේ රාජ සභාවේ ඔබතුමාට රජයේ අවි ගබඩා පාලනය භාර දෙන්නට තීරණය කළා. යෝජනාව කළේ මහ රජතුමායි. දීඝාභය මහසෙනෙවි කීවේ කුණ්ඩල බ්‍රාහ්මණතුමා රාජ්‍ය කටයුතුවලට මැදිහත් නොවන නිසා ඒ අදහස අතහැර දමන ලෙසයි. ඒ නිසා ඒ වගකීම මට පැවරුණා."

"සුදුස්සාට සුදුසු තැන හිමි විය යුතුයි." බ්‍රාහ්මණතුමා කීවේ මද සිනාවක් පාමිනි.

මොන විදියේ උපායන් යෙදුවත් වැඩක් වෙන්නේ නැහැ. දුටුගැමුණු රජතුමාගේ ජයග්‍රහණය ස්ථිරයි. ඔහුගේ අරමුණ හොඳයි. සූදානම හොඳයි. උපදේශිකාව ප්‍රබලයි.

ඒ වුණත් දුටුගැමුණු රජතුමා අනුරාධපුර රාජධානියට පැමිණි පසුව එකම සිංහලයකු හෝ විරුද්ධ වුවහොත්, අවියක් එසවුවහොත් ඒක සිරිනාගලාට, ජයනාථලාට, බෝධිනාගලාට මදිකමක්. බෝධිනාග අසේල මහ රජතුමාගේ ඇමතිවරයකුගේ පුතෙක්. ඔහුට ඓතිහාසික පන්නරයක් තිබෙන්නට ඕනෑ."

"බ්‍රාහ්මණ ආචාර්යතුමනි, පියාණන්ට පැවරී ඇති වැඩ සියල්ල කරන්නේ එක පොරොන්දුවක් මතයි. ඒ දුටුගැමුණු රජතුමා මහවැලි ගඟින් මෙගොඩ වූ පසු යුද්ධයට එකතු වන්නට. ඔහු දුනු ශිල්ප, කඩු හරඹවලට දක්ෂයි. මේ දිනවල ඇතුන්, අසුන් පිට යමින් පුහුණු වෙනවා.

" ඒ මදි, තවත් බොහෝ ව්‍යාපාර දැන් දැන්ම ඇරඹෙන්නට ඕනෑ. එළාර රජතුමාගේ දස රාජ ධර්මය සැබෑ තත්ත්වය පැහැදිලි කරන්නට රහසිගත පිරිසක් යෙදිය යුතුයි. කපටිකම, බොරුව, වංචාව, දූෂණය, ක්‍රෝධය, වෛරය, ශාසන විනාශය දැන් බොහෝ සිංහලයන්ට අමතක වෙලා.


යුක්තිය ඉෂ්ට කරලීමේ මුවාවෙන් කෙරෙන අපරාධ, දූෂණ නිමාවක් නැහැ. දිනපතා අසන්නට ලැබෙන නිධන් හෑරීම පිටුපස සිටින්නේ එළාර රජතුමා. නිධන් හොරුන්ට වැටුප් ගෙවන්නේ එළාර රජතුමා. ඒක රහසක් නොවෙයි. නැව්වලින් පිටරටට යන්නේ අපේ වටිනා ශාසනික වස්තු. ඒ ගැන දන්නේ සොළී නිලධාරීන් කිහිප දෙනකු පමණයි. සෑම කන්නයක් ම අස්වැන්න එකතු කිරීමෙන් පසු හාල් නැව් විස්සක් විසිපහක් සොළී රටට යවනවා.

"යුක්තිගරුක, ධර්මිෂ්ඨ රජතුමාගේත් එම රාජ්‍යයේත් සැබෑ තත්ත්වය නිදසුන් සහිතව කියාපාන්නට එම ධර්මිෂ්ඨකම්වලට ගොදුරු වූ නිර්භීත කාන්තාවන් පිරිසක් සංවිධානය කරන්නට ඕනෑ."

"දුටුගැමුණු රජතුමා රජරටට ඇතුළු වී ඉදිරියට තබන පියවරක් පාසා ජයග්‍රාහී හඬ වැඩිකරමින් ජනතා ප්‍රබෝධයක් ඇති කරන්නට ඕනෑ. එමඟින් යුද සෙබළුන් තුළ දේශ ප්‍රේමයක් ඇති කරන්නට ඕනෑ. පෞද්ගලික අමනාපකම් නිසා සතුරුපිලට ගැති වී සිටින පිරිසගේ නුවණ පාදන්නට අපේ සංඝයා වහන්සේලාට පුළුවන්."

"බ්‍රාහ්මණ පඬිතුමනි, විජිතපුර බලකොටුව ජය ගන්නට නම් ඒ තුළ ගැටුමක් ඇති කිරීම අවශ්‍යයි. දීඝාභයත් උපතිස්සත් විජිතපුර බලකොටුවෙන් එළියට යවා ගත හැකි නම් එය පහසුවෙන් ජය ගන්නට පුළුවන්. එසේත් නැතිනම් ඔවුන් දෙදෙනා එකතු වී සිටින පිල වැරදි බව ඔවුන්ට වටහා දෙන්නට ඕනෑ. මේ සඳහා ඔබතුමාගේ සහාය ලබා ගන්නැයි මහාසිව මා හිමියන් රහස් තල්පතකින් දන්වා තිබෙනවා."

මේ සිංහල දේශය, බෞද්ධ රට විදේශික ආක්‍රමණයන්ට අල්ලාගන්නට දීම වැරදියි. මේ රට සූරාගෙන කෑම විනා දියුණුවකට යැවීමක් ඔවුන්ගෙන් සිදුවන්නේ නැහැ. ඔවුන්ට මේ රට රස වැටිලා. ධර්මිෂ්ඨ මුහුණු පෙන්නාගෙන තවත් කාලයක් ඉන්නටයි වෑයම් කරන්නේ. ඒ වගේම දුටුගැමුණු රජතුමාගේ ප්‍රතිරූපය බිඳ දැමීමට වැටුප් ගෙවන සංවිධානාත්මක පිරිසක් හදලා.



අයන්ති විතාන